# සෙඳෙව

சந்தாவ

ශ්‍රී ලංකා
මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2015 ජනවාරි/ පෙබරවාරි



වෙබ් අඩවිය : www.sendewa.org විද්‍යුත් ලිපිනය info@cbpa.com
අංක : QD/168/News/2014 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.





## විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කර ගැනීමේ ප්‍රශ්නයේ වර්තමාන තත්ත්වය

සාමාජික ඔබ විසින් 2014 අප්‍රියෙල් මස 28 වන දින ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමයේ වර්තමාන විධායක කමිටුව පත්කර ගන්නා ලදී. ඉන්පසු 2014 මැයි මස 01 වන දින සිට එම විධායක කමිටුව සංගමයේ වැඩ කටයුතු ආරම්භ කරන්නට යෙදින. මෙහිදී විධායක කමිටුවේ ප්‍රධාන කාර්ය ය වූයේ විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කර ගැනීමේ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා කැප වීමයි.

එය පෙරදැරි කරගෙන 2014 අගෝස්තු මස 29 වන දින එම විධායක කමිටුවේ සහභාගීත්වයෙන් අධිපතිතුමා හමු වූහ. එම අවස්ථාවේදී විශ්‍රාම වැටුප් අතර ඇති පුළුල් විෂමතාවය ඔහුට පැහැදිලි කර දෙන ලදී. වර්තමානයේ විශ්‍රාම යන සේවකයෝ 2006 වසරේ සිට වැටුප් වැඩිවීම් ලබා පැරණි විශ්‍රාමිකයින්ට සාපේක්ෂව ඉතා විශාල විශ්‍රාම වැටුපකට හිමිකම් කියති. නමුත්, 2006 වසරේ සිට ඉතා අඩු ප්‍රතිශත වලින් විශ්‍රාම වැටුප් වැඩිකිරීමේ හේතුවෙන් වර්තමාන විශ්‍රාමිකයා හා අතීත විශ්‍රාමිකයා අතර විශ්‍රාම වැටුපේ විශාල පරතරයක් ඇති විය. එමෙන්ම 2013.08.22 දින හිටපු විධායක කමිටුව අධිපතිතුමා හමුවූ අවස්ථාවේදී විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් කිරීම සඳහා කිසියම් ක්‍රමවේදයක් ඉදිරිපත් කරන ලෙස අපෙන් ඉල්ලා සිටින ලදී.

ඒ අනුව විෂමතා ඉවත් කර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා පහත සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් විධායක කමිටුව විසින් පත් කරන ලදී.

01. ලක්ෂ්මන් ද සිල්වා මයා
02. ජයලාල් ජයවර්ධන මයා
03. ඔස්ටින් මිහිඳුකුලසූරිය මයා
04. R. M. සිරිසේන මයා
05. W. P. ඇක්මන් මයා
06. E. F. G. A. පෙරුමාල් මයා
07. S. සිවකුමාරන් මයා

මණ්ඩලයේ යෝජනා අනුව 1994 සිට 2012 දක්වා විශ්‍රාම ගිය විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් වර්ෂ 3කට එනම් 2006, 2009 හා 2012 යන වර්ෂවලට ප්‍රතිව්‍යුහ ගත කරන්නේ නම්, ඒ සඳහා දනට පවතින විශ්‍රාම වැටුප වැඩිකළ යුතු ප්‍රතිශතයන් කොපමණද යන්න පෙන්වා දෙන ලදී. එහිදී 1994 ට පෙර විශ්‍රාම ගිය සියල්ලන් 1994 වසරේ විශ්‍රාම ගියා සේ සළකා ඇත.

| පහත සඳහන් වසරවල විශ්‍රාම ගිය තැනැත්තන් | පහත සඳහන් වසර සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය අනුපාතයන් | | |
|---|---|---|---|
| | 2006 | 2009 | 2012 |
| 1994, 1995, 1996 | 94% | 168% | 288% |
| 1997, 1998, 1999 | 75% | 141% | 249% |
| 2000, 2001, 2002 | 79% | 147% | 257% |
| 2003, 2004, 2005 | 35% | 86% | 169% |
| 2006, 2007, 2008 | 9% | 25% | 81% |
| 2009, 2010, 2011 | -31% | - 5% | 38% |

### ජනවාරි 31 දා - ගුණ සැමරුම් දා

කෲර බෝම්බ ප්‍රහාරයෙන් 1996 ජන. 31 දා මිය ගිය අප මහ බැංකු කාර්ය මණ්ඩලයේ සොයුරු සොයුරියන් සැමරීමේ දිනයට, අප විශ්‍රාමික සංගමය විසින් විශේෂ වැඩසටහන් මාලාවක් මෙවර නොපවත්වන අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලබන ගුණ සැමරුම හා පුණ්‍ය කර්මයන්ට සහභාගි වනු සඳහා 31 වන දින පෙ. ව. 09.30ට පමණ මහ බැංකු පරිශ්‍රය ඉදිරිපිටට පැමිණෙන ලෙස සියළුම විශ්‍රාමික මහ බැංකු සාමාජික සාමාජිකාවන්ට මෙයින් ගෞරවයෙන් හා සෙනෙහසින් ඇරයුම් කරමු.

ඉතා විශාල ප්‍රතිශතයන් මගින් පෙන්නුම් කරන්නේ, පැරණි විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප 2006, 2009, 2012 වසර වලදී විශ්‍රාම ගිය අයට සාපේක්ෂව එතරම් ප්‍රමාණයකින් පසු පසින් සිටින බවයි.

තත්ත්වය මෙසේ තිබිය දී 2014 ඔක්තෝම්බර් 24 දින 2015 වසර සඳහා රජයේ අයවැය ලේඛණය ඉදිරිපත් කෙරින. එමගින් කියවුනේ රජයේ විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් විෂමතාවන් ඉවත් කර 2015 වසර සඳහා යාවත්කාලීන කරන බවත්, එතෙක් 2014 නොවැම්බර් මස සිට රු. 2500/- ක මාසික අන්තර් දීමනාවක් ගෙවන බවත් ය. රජයේ විශ්‍රාමිකයින්ගේ ප්‍රශ්නයට සමාන ප්‍රශ්නයක අප ද ගැලී සිටින හෙයින්, විෂමතා ඉවත් කිරීමේ කමිටුවේ නිර්දේශයන් පදනම් කරගෙන 2012 වසරට මහ බැංකු විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිව්‍යුහ ගතකරන ලෙසටත්, ඒතෙක් රු.7500/- ක මාසික අන්තර් දීමනාවක් ගෙවන ලෙසටත් ඉල්ලා 2014-11-04 දින ඉල්ලීමක් මහ බැංකු අධිපති තුමා වෙත යවන ලදි. (යවන ලද ලිපියේ පිටපතක් 04 වැනි පිටුවේ ඇත.)

අපගේ ඉල්ලීම පිළිබඳව වැඩිපුර කරුණු පැහැදිලි කිරීම සඳහා අධිපතිතුමා සමග සාකච්ඡාවක් ද ඉල්ලා සිටියෙමු. එනමුත් අධිපතිතුමා කාර්යබහුල යැයි පවසමින්, එම සාකච්ඡාව සහකාර අධිපති ලංකාතිලක මහතා සමග පවත්වන ලෙසට අධිපති කාර්යාලයෙන් අප වෙත දන්වා එවීය. ඒ අනුව එම සාකච්ඡාව 2014-11-13 වෙනි දින සහකාර අධිපති ලංකාතිලක මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි. බැංකුව පාර්ශවයෙන් ලංකාතිලක මහතා සමග මානව සම්පත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එක්ව සිටි අතර, සංගමය පාර්ශවයෙන් සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික සහභාගි වූහ.

මෙම රැස්වීමේදී අපගේ ප්‍රධාන කාර්යය වූයේ වැටුප් විෂමතා ඉවත් කිරීම 2014 දෙසැම්බර් 31 වන දිනට පෙර සිදු කර ගැනීමත්, 2015 වසරේ සිට විෂමතා ඉවත් කළ නව වැටුපක් ලබා ගැනීමත් ය. එය ප්‍රමාද වන්නේ නම් රු. 7500/- ක මාසික අන්තර් දීමනාවක් ඉල්ලා සිටින ලදි. ලංකාතිලක මහතාගේ අදහස වූයේ රජයේ විශ්‍රාමිකයින්ට අන්තර් දීමනාවක් ලබාදී ඇතත්, රාජ්‍ය බැංකු සඳහා එය ලබාදී නොමැති බැවින් එම යෝජනාව මෙම අවස්ථාවේදී සලකා බැලිය නොහැකි බවයි. කෙසේ වෙතත් විෂමතා ඉවත් කිරීමට අප විසින් ඉදිරිපත් කර ඇති ක්‍රමවේදය පිළිගන්නා බවත්, 2015 වසරේ වැටුප් වැඩිවීමේ සාකච්ඡා පටන් ගන්නා අවස්ථාවේදී ඒ පිළිබඳව සලකා බලන බවත්ය. ලංකාතිලක මහතාගේ පිළිතුරෙන් අප සෑහීමට පත් නොවුන නිසා, අධිපතිතුමා හමුවීමට නැවත වරක් අපි උත්සාහ කළෙමු. එවන් අවස්ථාවකදී ඉතාමත් සුළු වේලාවකට අධිපතිතුමා හමුවීමට සභාපතිට අවස්ථාව ලැබිණ. එහිදී අධිපතිතුමා දන්වා සිටියේ මැතිවරණයක් ප්‍රකාශයට පත්කර ඇති මෙවන් අවස්ථාවක වැටුප් වැඩිවීමක් ලබාදීම හෝ අන්තර් දීමනාවක් ලබා දීමට සලකා බැලිය නොහැකි බවයි. කෙසේ වෙතත් අපගේ ලිඛිත ඉල්ලීම 2014 දෙසැම්බර් 14 වෙනි දින අධිපතිතුමා වෙත යවන ලදී (05 වෙනි පිටුව බලන්න.) මේ අතරතුර යම් සහනයක් ලබාගනු වස් 2014.12.24 දින සභාපති, ලේකම් භාණ්ඩාගාරික විසින් නියෝජ්‍ය අධිපති තුමා හමුවන ලදී. කරුණු ඉදිරිපත් කිරීමේදී දැනගන්නට ලැබුණේ විෂමතා ඉවත් කිරීම සඳහා අප විසින් ලබාදී ඇති යෝජනා එතුමා දැන නොසිටි බවයි. එමනිසා එම අවස්ථාවේදීම 2014.11.04 දින අප විසින් අධිපතිතුමා වෙත යොමුකළ ලිපියේ පිටපතක් ලබා දී ඒ පිළිබඳව විස්තර ඉදිරිපත් කරන ලදී. නියෝජ්‍ය අධිපතිතුමාගේ අදහස වූයේ ශ්‍රී ලංකා මහ බැංකුවට අලුතින් බඳවා ගන්නා ලද අයට විශ්‍රාම වැටුප් හිමිකම් නොමැති හෙයින් ඒ අයට අලුත් විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීමට මේ දිනවල කටයුතු කරන බැවින්, ඒ අයට ප්‍රමුඛත්වය දිය යුතු බවයි. ඉන් අනතුරුව 2015 වැටුප් වැඩිවීමේ සාකච්ඡා පටන් ගන්නා බවත්, එම අවස්ථාවේ අපගේ යෝජනා කෙරෙහි සැලකිල්ල යොමු කරන බවත් ය. එම ක්‍රියාවලිය සඳහා කලක් ගතවන හෙයින් මාසික අන්තර් දීමනාවක් විශ්‍රාමිකයින් වෙත ලබා දෙන ලෙස අපි විසින් ඉල්ලා සිටියෙමු. නියෝජ්‍ය අධිපතිතුමාගේ පිළිතුර වූයේ විෂමතා ඉවත් කිරීම සම්බන්ධ අපගේ යෝජනා අධ්‍යනය කරන තෙක් අන්තර් දීමනාවක් ලබා දිය නොහැකි බවයි. මෙම පසුබිම යටතේ අපට පෙනී ගියේ 2014 නොවැම්බර් 04 වන දින අප විසින් ඉදිරිපත්

කළ යෝජනා කිසිදු ක්‍රියා මාර්ගයක් නොගෙන පසෙකලා තිබෙන බවයි. ඒ නිසා ඒ බව නියෝජ්‍ය අධිපතිතුමා වෙත සැලකර සිටි යෙමු. අපි අපගේ යෝජනා කොතෙක් දුරට කළමණාකාරීත්වය පිළිගන්නේද යන්න පිළිබඳ අධ්‍යනය කර සාකච්ඡාවක් මගින් අප වෙත දනුම් දෙන ලෙස ඉල්ලා සිටියෙමු. විශේෂ කමිටුවක් පත්කර විමෙතා ඉවත් කිරීමේ අපගේ යෝජනා අධ්‍යනය කිරීමට කටයුතු කරන බවට අවසන් වශයෙන් නියෝජ්‍ය අධිපතිතුමා එකග විය.

තත්වය මෙසේ හෙයින් ඊළඟට අප ගත යුතු පියවර සම්බන්ධයෙන් සාමාජික ඔබට යෝජනා ඉදිරිපත් කළ හැකිය. ඒ සඳහා යෝජනා ඇතොත් ලිඛිතව සංගමය වෙත එවන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.




**ලක්ෂ්මන් ද සිල්වා**

**සභාපති**

**ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය**





# සමාව දෙනු මැන ..!

**'දශක හතරක මතක අතරින්'** නමින් 2014 අගෝස්තු සැප්තැම්බර් 'සැඳෑව' කලාපයේ පළවූ ලිපිය සම්බන්ධයෙනි.

අදාල ලිපියේ පළවූ යම් යම් සිද්ධීන් හා ඊට සම්බන්ධ පුද්ගල නාමයන් පිළිබඳව දිගින් දිගටම විරෝධය ප්‍රකාශ කරමින් අප විධායක කමිටුව වෙත ඉදිරිපත් කෙරෙන නිර්නාමික ලිපි සංඛ්‍යාව ප්‍රමාණාත්මකව වැඩිය.

එම ලිපි මගින් දැක්වෙන දැඩි විරෝධතාවයන්, පැහැදිලි කිරීම්, විවේචනය කිරීම්,මානව ගුණ ධර්මයන් හා මඟ පෙන්වීම් පිළිබඳව අප විධායක කමිටුවේ හා සගරා සංස්කාරක මණ්ඩලයේ අවධානය යොමු කරන ලද අතර, එවැනි දෝෂයන් ඉදිරියේ දී සිදු වීමට ඉඩ නොතබන බවද ප්‍රකාශ කරමු.

එසේ මග පෙන්වූ නිර්නාමික සැමට කෘතඥතාවය පුද කරන අතර, අදාල ලිපිය පළ වීමෙන් සිත් කම්පාවක් සිදු වූයේ නම්,ඒ පිළිබඳව අප විධායක කමිටුව ම අතිශය කණගාටුවට පත්වන බව ද දන්වමු.

'සැඳෑව' වෙත ලිපි යොමු කිරීමේ දී සිතාමතාම පුද්ගලනාම හා චරිත කෙරෙහි එල්ල විය හැකි අපහාස, උපහාස හා පරිහාසාත්මක යෙදුම් හා ද්වේශ සහගත ප්‍රකාශන වැනි දෝෂවලින් වියුක්ත රචනා ඉදිරිපත් කිරීමට සැලකිලිමත් වන ලෙස ලේඛක ලේඛිකාවන්ගෙන් දයාබරව ඉල්ලා සිටිමු.

එමෙන්ම **නිර්නාමික ලිපි යොමු කිරීම ද නිදොස් වූවක් හෝ මානව ශික්ෂණයකින් යුක්ත වූ ක්‍රියාවක් නොවන බවද සැලකුව මැනවි**.

-සංස්කාරක-

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය

234/01/22, ෂෙරටන් පාක්, කෝපියාවත්ත, රාගම.

දුරකතන අංක 0712 207102, 0777 412289


ගරු අධිපතිතුමා,
ශ්‍රී ලංකා මහ බැංකුව,
ජනාධිපති මාවත, කොළඹ 01.

2014 නොවැම්බර් 4

මහත්මයාණෙනි,

## විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කර ගැනීම

ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් අතර පැන නැගී ඇති විෂමතාවයන් ඉවත් කිරීම සඳහා කටයුතු කරන මෙන් ඉල්ලා 2012 අගෝස්තු 16 වන දින හා 2013 පෙබරවාරි 18 වන දින ඔබතුමා වෙත අප විසින් ලිඛිතවූ ඉල්ලීම් දෙකක් ඉදිරිපත් කරන ලදි. ඔබතුමාගේ පහසුව සඳහා එම ලිපි වල පිටපත් දෙකක් මේ සමග සපයන්නෙමු.

2013 අගෝස්තු 22 හා 2014 අගෝස්තු 29 යන දිනයන්හි ඔබතුමා හා අප නියෝජිත පිරිස් අතර පැවැත්වුණු සාකච්ඡාවන්හිදී ද යථෝක්ත විශ්‍රාම වැටුප් විෂමතාවයන් පිළිබඳව ප්‍රශ්නය ඔබතුමා හමුවට අපි ඉදිරිපත් කලෙමු. එම කරුණු වලට සාවධානව ඇහුම්කන් දෙමින් මෙම ගැටළුව නිරාකරණය කිරීම සඳහා යම් කිසි ක්‍රමවේදයක් සකසා ඉදිරිපත් කරන ලෙස ඔබතුමා අප වෙතින් කළ ඉල්ලීම ස්තුතිපූර්වකව සිහිපත් කරමු. ඔබතුමාගේ එම ඉල්ලීමට ගරු කරමින් අප විසින් සකසන ලද එක්තරා ක්‍රමවේදයක් මේ සමග ඉදිරිපත් කැරුණු. එහිදී අප සැලකිලිමත් වූ මූලික කරුණු කිහිපයක් මෙසේය.

1. අපේ අවධානය ප්‍රථමයෙන්ම යොමු වන්නේ අදින් විසි වසරකට පෙර එනම් 1994 විශ්‍රාම ලැබූ පිරිස කෙරෙහි ය. 1994 ට පෙර විශ්‍රාම ලැබ දැනට ඉතිරිව සිටින සුළු පිරිස වෙනුවෙන් ද 1994 පදනම ම අදාළ කර ගන්නා ලදි.
2. 2012 වන විට ඒ ඒ පුද්ගලයාගේ විශ්‍රාම වැටුප ගණනය කරන ලද්දේ අවුරුදු තුනකට වරක් සිදු කෙරුණු විශ්‍රාම වැටුප් සංශෝධනයන් හි දී භාවිතා කර ඇති අනුපාතයන්ට අනුවය.
3. සියලුම ගණනයන් සඳහා අදාළ ශ්‍රේණිවල ආරම්භක මූලික වැටුප් තලය භාවිතා කොට ඇත.
4. 2006, 2009 හා 2012 වසර වලට සාපේක්ෂව විශ්‍රාම වැටුප් ප්‍රතිව්‍යුහ ගත කිරීම සඳහා යොදා ගත යුතු ප්‍රතිශත අනුපාතයන් ගණනය කිරීම.

ඒ අනුව 1994 සිට 2011 වසර අවසානය දක්වා විශ්‍රාම ලැබුවන්ගේ විශ්‍රාම වැටුප ප්‍රතිව්‍යුහ ගත කිරීම සඳහා අදාළ කර ගත යුතු අනුපාතය කොපමණ ද යන්න දක්වන සටහනක් මෙහි පහත දක්වා ඇත.

අවසන් ප්‍රතිඵලය

| පහත සඳහන් වසර වල විශ්‍රාම ගිය පැනැත්තන් සඳහා | පහත සඳහන් වසර සඳහා ප්‍රතිව්‍යුහ ගත කිරීමට අවශ්‍ය අනුපාත | | |
|---|---|---|---|
| | 2006 | 2009 | 2012 |
| 1994, 1995,1996 | 94% | 168% | 288% |
| 1997, 1998,1999 | 75% | 141% | 249% |
| 2000, 2001,2002 | 79% | 147% | 257% |
| 2003, 2004,2005 | 35% | 86% | 169% |
| 2006, 2007,2008 | -9% | 25% | 81% |
| 2009, 2010,2011 | -31% | -5% | 38% |

අපගේ මෙම ව්‍යායාමයේ අපේක්ෂාව වනුයේ 2012 ජනවාරි පළමු දිනට පෙර විශ්‍රාම ලැබූ සියල්ලන්ගේම විශ්‍රාම වැටුප් වල විෂමතා ඉවත් කොට 2012 ජනවාරි පළමු දිනට ප්‍රතිව්‍යුහ ගත කිරීමයි. 2014 දෙසැම්බර් 31 වන දිනට පෙර මෙම ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කිරීමට මහ බැංකු පාලනාධිකාරිය ක්‍රියා කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. එවිට 2015 වසරේ සිට වසර 3 කට වරක් සිදු කෙරෙන මහ බැංකු වැටුප් ප්‍රතිශෝධනයන් හිදී විශ්‍රාම වැටුප් සංශෝධනය කළ යුතු ප්‍රතිශතයන් තීරණය කිරීමට මහ බැංකු පාලනාධිකාරියට ඉඩ ප්‍රස්තාව සැලසෙනු ඇත. එහිදී මහ බැංකු සේවක වැටුප් වැඩි කරන ප්‍රමාණයන්ට අනුරූප වන, එමෙන්ම සියලුම විශ්‍රාමිකයින්ට සමාන වන යම් ප්‍රතිශතයක් උපයෝගී කර ගැනීමට අදාළ බලධාරීන් කටයුතු කරන්නේ නම් විශ්‍රාම වැටුප් විෂමතාවයන් පිළිබඳ ගැටළුවක් අනාගතයේ දී නිර්මාණය නොවනු ඇතැයි අපි විශ්වාස කරමු.

ගරු අධිපති තුමෙනි, වත්මන් රජයේ 2015 අයවැය ලේඛණය ඉදිරිපත් කිරීමේ දී අතිගරු ජනාධිපති තුමා පවතින විශ්‍රාමිකයන් හා සම්බන්ධව දක්වන ලද කරුණාබර සැලකිල්ල කෙරෙහි ද ඔබතුමාගේ අවධානය යොමු කරනු කැමැත්තෙමු. එමෙන්ම සැළකියේ පැවති 2014 වැඩිහිටි දින උත්සවයේ දී අතිගරු ජනාධිපති තුමාගේ අදහස් හා සමානව යමින් ඔබතුමා විශ්‍රාමිකයින් කෙරෙහි දක්වන ලද යහපත් ආකල්පය ද, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ''දිවි සුරැකුම් විශ්‍රාම සැලසුම'' හඳුන්වා දීමේ දී ඔබතුමා පළ කළ අගනා අදහස් ද අපගේ ඉමහත් ගෞරවයට හා සතුටට හේතු වූ බව මෙහි ලා ප්‍රකාශ කරමු.

විශ්‍රාමිකයින්ගේ වැටුප් විෂමතාවයන් ඉවත් කිරීමේ ක්‍රියාවලියට ගතවන කාලය ගැන සලකා එම කටයුතු සමාප්ත වන තෙක් 2014 නොවැම්බර් මස සිට මාසික අතුරු දීමනාවක් ගෙවීමට අතිගරු ජනාධිපතිතුමන් 2015 අයවැය ලේඛණය ඉදිරිපත් කරමින් දුන් ප්‍රතිඥාව එක හා සමාන අර්බුදයක ගැලී සිටිනා මහ බැංකු විශ්‍රාමිකයින් වෙනුවෙන් ද ගලපමින් රු. 7500/- ක අතුරු මාසික දීමනාවක් 2014 නොවැම්බර් මස සිට ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින් හට ද ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තුතියි
මෙයට විශ්වාසී

..................................

ලක්ෂ්මන් ද සිල්වා
ගරු සභාපති

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය

*234/01/22, ෂෙරටන් පාක්, කෝපියාවත්ත, රාගම.*

දුරකතන අංක 0712 207102, 0777 412289


2014 දෙසැම්බර් 14

ගරු අධිපති තුමා,
ශ්‍රී ලංකා මහ බැංකුව,
ජනාධිපති මාවත,
කොළඹ 01.

මහත්මයාණනි,

**<u>විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කර ගැනීම.</u>**

ශ්‍රී ලංකා මහ බැංකුවේ මානව සම්පත් අධ්‍යක්ෂ අප ඇමතූ ඔහුගේ 2014 නොවැම්බර් 17 වන දින දරන ලිපිය මගින් අප වෙත දන්වා ඇත්තේ අපගේ විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීම ද්‍රෛ වාර්ෂිකව සිදු කරන මහ බැංකුවේ වැටුප් සම්බන්ධ සාමූහික ගිවිසුම සකස් කරන අවස්ථාවේ දී සිදු කරන බවයි. කෙසේ වෙතත් එවන් ලිඛිත ප්‍රතිචාරයක් දැක්වීම පිළිබඳව පළමුකොටම අපි අපේ ස්තුතිය මෙහි ලා ප්‍රකාශ කරමු.

මහ බැංකු විශ්‍රාමිකයන් ඉතා දිගු කලක් තිස්සේ පීඩාවට පත් කරනු ලැබූ විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කර ගැනීම හා අදාළ ගැටළුවට සාධනීය විසඳුමක් ලබා දීම සඳහා ඔබ තුමා දක්වනු ලබන උනන්දුව කෙරෙහි අපගේ හෘදයාංගම කෘතඥතාව පළ කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමු. එසේම අධිපතිතුමනි ලු අපගේ මෙම අභියාචනයට ද ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිමු.

වසර ගණනාවක් දුර සිට ක්‍රමයෙන් අද පවත්නා අර්බුදය තෙක් මෝරා පැමිණි මෙම විශ්‍රාම වැටුප් විෂමතා පිළිබඳ ගැටළුව නිරාකරණය කර ගැනීමට ඒ ඒ අවස්ථාවන්හිදී ම අප දැරූ ප්‍රයත්නයන් ඵල නොදැරූයේ අදාළ ඇතැම් පාර්ශ්වයන් මහ බැංකු විශ්‍රාමිකයින් කෙරෙහි සානුකම්පිත නොවීමත් අපගේම අවාසනාවත් හේතුවෙනි. එදා මහ බැංකුවේ උසස්ම තලයේ නිලධාරියෙකු අද ලබන විශ්‍රාම වැටුප අද මහ බැංකුවේ සුළු සේවකයෙකු ලබන වැටුපෙන් පියවර ගණනාවක් පහළට වැටී ඇති අයුරු සැබවින්ම ඛේදනීයය. මේ තත්වය මහ බැංකු පාලනාධිකාරියට වටහා දීමට අප දැරූ විවිධ පරිශ්‍රමයන් ඔස්සේ ඔබතුමා එම ගැටළුව තත්වාකාරයෙන් හඳුනාගැනීම හා වටහාගැනීම නවෝදයක සුභ නිමිත්තක් ලෙස අපි දකිමු

රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් විෂමතා ගැටළුව මුළුමනින්ම නිරාකරණය කරලීමට අතිගරු ජනාධිපතිතුමාගේ දිරිමත් මැදිහත්වීම අප සියල්ලන්ටම මහඟු ආදර්ශයකි. යා යුතු නිවැරදි මග අතිගරු ජනාධිපතිතුමා පැහැදිලිවම පෙන්වා දී ඇත. අධිපතිතුමනි, රාජ්‍යානුබද්ධ ආයතනයක් වන ශ්‍රී ලංකා මහ බැංකුවට ද එම ප්‍රතිපත්තානුකූල මග ඔස්සේ ගමන් කළ හැකිය.

ගරු අධිපතිතුමනි, අපගේ ඉල්ලීම වනුයේ 2012 ජනවාරි පළමුවන දිනට පෙර විශ්‍රාම ලැබූ සියල්ලන්ගේම විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කොට 2012 ජනවාරි පළමුවන දිනට ප්‍රතිව්‍යුහගත කිරීමයි. එම ක්‍රියාවලිය 2014 දෙසැම්බර් 31 වන දිනට පෙර ක්‍රියාත්මක කරන ලෙස අපි ඔබතුමාගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු. එවිට අප සියල්ලන්ටම අතීතයේ සියලු දෝෂයන් මකාගෙන අනාගතයට සුභවාදීව පියවර තැබීමට මග හෙළිපෙහෙළි වනු ඇත.

මහ බැංකුවේ වත්මන් සේවක සමූහයට ඉතාම ප්‍රසාදජනක අයුරින් සත්කාර කරනු ලබන ඔබතුමා මහ බැංකුවේ අතීත සේවක පිරිසට ද ඉතාමත්ම කාරුණිකව සළකනු ලැබූ අධිපතිතුමකු වශයෙන් ඒ සියල්ලන්ගේම ගරුත්වයට හා කෘතඥතාවට නිමිකරුවෙකු වන්නේය.

ස්තුතියි.

මෙයට,
විශ්වාසී,

ලක්ෂ්මන් ද සිල්වා
ගරු සභාපති

# Present situation of the attempt to remove Pension Anomalies

The present Executive Committee of the Central Bank Pensioners' Association was appointed at the Annual General Meeting held on 28/04/2014. Since then foremost attention was to find a workable solution for pension anomalies inherited by management decisions. The first committee meeting was held on 01/05/2014.and decided to request an interview with the Governor.

After numerous requests the committee managed to meet the Governor. The entire committee met the Governor on 29th August 2014.We explained to Governor that the Central Bank pensioners' were undergoing lots of hardships due to very low pensions they receive now. The disparity in pension became greater due to the fact that the high salary increases granted since 2006.And a meager pension increases granted after the year 2006 to pensioners. The governor requested the committee to submit our proposals to be considered at the next salary increases taken up in the year 2015.

In compliance with the Governor's request we formulate a subcommittee to look into anomalies and to make recommendation to the committee. The subcommittee was comprised of the following members.

(1) Lakshman desilva.
(2) Jayalal Jayawardena .
(3) Austin Mihindukulasuriya.
(4) R.M.Sirisena.
(5) W.P.Akman.
(6) E.F.G.A.Perumal.
(7) W.D.A.Raymand.
(8) S.Sivakumaran.

The executive committee reviewed the proposals of the subcommittee and decided that the pensioners those who retired between 1994 and 2012 have to be increased. So as to update them to the level of those who retired in the years of 2006, 2009 and 2012.the under mentioned table will show you the glaring anomalies which had occurred due to increases granted after 2006.

| Those who retired in the following years | Required percentage increases for reschedule for following years | | |
|---|---|---|---|
| | 2006 | 2009 | 2012 |
| 1994, 1995, 1996 | 94% | 168% | 288% |
| 1997, 1998, 1999 | 75% | 141% | 249% |
| 2000, 2001, 2002 | 79% | 147% | 257% |
| 2003, 2004, 2005 | 35% | 86% | 169% |
| 2006, 2007, 2008 | 9% | 25% | 81% |
| 2009, 2010, 2011 | -31% | - 5% | 38% |

According to the table above, it is obvious that older pensioners require a higher percentage increase of pension. It also indicates how far behind the older pensioner s are lagging, in relation to those who retired in the years 2006, 2009 and 2012.The former Government presented the budget on 24th October 2014 for the year2015.. The Former president as the minister of Finance proposed an interim allowance of Rs. 2500/= for all government pensioners and also to update their pensions to the level of year 2015.So that all pension anomalies would be rectified for Government pensioners. Accordingly Rs. 2500/= interim allowance to Government pensioners were paid since November 2014.

As the Central Bank Pensioners do have the same problem the executive committee Forwarded a letter on 04th November 2014, to the Governor requesting an updating of pensions of all pensioners to the level of 2012, and also to pay an interim allowance of Rs.7500/= monthly, until the anomalies are rectified.

We requested an appointment with the Governor to discuss new issues, but we managed to meet Mr. Lankathilake AG. Accordingly the committee met him on 13th November.2014.The committee represented by the president, Secretary and Treasurer. At the meeting we stressed and intimated to AG that we want a rectification on our pension anomalies before the next salary increases taken up. And also pointed out that interim allowance of Rs. 7500/= be granted immediately as the Government had already paid it to Government pensioners. AG said that it would not be possible to grant an interim allowance as the state Banks had not considered it. And our proposals would be considered at the next salary increase taken up for present staff.

As we were not satisfied with the attitude of the AG, committee wanted to meet the Governor. The president met Governor for a brief moment and requested to solve our problems. However, Governor was of the view that as the presidential election has been called for this request cannot be granted, and after the election he could consider. However, we made our written submission to the Governor on 14th December 2014.

On the other hand we tried to seek some help from DG (W), and met him on 24th December 2014. The president, Secretary and Treasurer met DG (W). Although we explained everything to him, unfortunately he was unaware of the proposals which we submitted. We presented a copy of the letter we sent to Governor on 04th November 2014.to DG. Any how he was more concerned about introducing a pension scheme for new appointees. DG too viewed that interim allowance could not be granted until they study our proposals. We indicated that the management is not in a position to consider our proposals. Therefore requested a committee to be appointed and to inform us about it , and also allow us to represent our grievances to this committee.

Above description will allow you to have some idea of what we have done and action taken on behalf you to have a better pension? You may now make suitable representation to the association.

**Lakshman De Silva**
The president , Central Bank
Pensioners, Association

## 2015 නව වසරට සුභ පැතුම්

අලුත් වීම ස්වභාවිකයි. ඒ වගේම පරණ වීමත් ස්වභාවිකයි. මේ සංකල්ප දෙකම සම්බන්ධීකරණය කරන්නේ, කාලය (Time) විසිනුයි. කාර්යක්ෂම මිනිසාට හා බුද්ධිමතාට දැනෙන ලෙසිනුත්, අලසයාට හා බුද්ධි හීනයාට නොදැනෙන, නොවැටහෙන ලෙසිනුත් කාලය හොර රහසේම ගලා ගෙන යනවා. කාලයට විකල්පයක් නැහැ. ආදේශයක් නැහැ. අනුපූරකයක් නැහැ. බැස යන දියෙන් වතක් නෙමෙයි දෙසක්ම (දෝසක්ම) ගන්න කියලා කියන්නෙත්, ''අප්පමාදෙන සම්පාදෙත'' කියලා කිව්වෙත් ඒකයි. 2014 ගෙවුනා. 2015 ආවා. පෙනුමට 4 ඉලක්කම 5 ඉලක්කම වුනත් සිද්ධ වුනේ කාලය ගෙවී ගිය එකයි. වියපත් වීමත් සමග අලුත් වීම් අලුතෙන් හිතන්නට පෙළඹ වීමත් ජීවයට ජවයක්. ඒ වගේම සවියක්.

ශ්‍රී ලංකා මහ බැංකුවේ වියපත්, පැරණි, විශ්‍රාමික සේවක මණ්ඩලය සමග සෘජුවම - සමීප සම්බන්ධතා පවත්වන කාර්ය මණ්ඩල සේවා කළමණාකරන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හා කාර්ය මණ්ඩලයටත්, මහ බැංකුවේ ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයටත් සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයටත්, රාජගිරියේ මුද්‍රණාලයේ කළමනාකරු හා කාර්ය මණ්ඩලයටත් නව අධිපතිතුමා ඇතුළු සමස්ථ ශ්‍රී ලංකා මහ බැංකු කාර්ය මණ්ඩලයටත් නව වසරට අපෙන් සුභ පැතුම්

අපට ලෙන්ගතු ඔබ සැමට අපිත් ලෙන්ගතුයි. ලෙන්ගතුකමේ වටිනාකම මුදල් කන්දරාවකටවත් ගන්න බැරි බව හැබැවත්. හැබෑව මිනිසාවට වඩා ජීවමානයි. ඔබ සැමට ආසිරි.




විධායක කමිටුව -



# නව රාත්‍රී යනු..... ?



(මහ බැංකු මුදල් මණ්ඩලයේ සාමාජිකා
මනෝහරී රාමනාදන් මහත්මිය විසින් 2014-10-03 වන දින,
මහ බැංකු පරිශ්‍රයේ පැවැති නව රාත්‍රී උත්සවයේදී පැවැත්වූ
කතාවේ සිංහල පරිවර්තනයයි.)

හින්දු භක්තිකයන් නවරාත්‍රී උත්සවාකාරයෙන් සැමරීමෙන් බලාපොරොත්තු වන්නේ, තමන්ට ජිවිතයේ දී මුහුනපාන්නට සිදු වන දුක් කම්කටොළු හා විවිධ පීඩාවන්ගෙන් මිදීම සඳහා පරාශක්ති දේව මෑණියන්ගේ ආශිර්වාදය ලබා ගැනීමටය. පරාශක්ති දෙවිඳු යනු සියළු සත්ත්වයන්ට අසීමිත කරුණාවන්ත වූ ශ්‍රේෂ්ඨ දේව මාතාවකි.

නව රාත්‍රී උත්සවය අවුරුද්දේ එක් එක් කාල වලදී පවත්වනු ලැබේ. ඒවා නම්, මෙසේය.

- වසන්ත නව රාත්‍රී
- අෂ්ඩ නව රාත්‍රී
- සාරදා නව රාත්‍රී
- ගුප්ත නව රාත්‍රී

මේවායින් ඔක්තෝම්බර් මාසයේ දී පවත්වනු ලබන සාරදා නවරාත්‍රී නොහොත් මහා නව රාත්‍රී ඉතා වැදගත් කොට සැලකේ. මහා නව රාත්‍රී උත්සවය දින නවයක් පුරා පවත්වනු ලබන උත්සවයකි. අලුත් සඳ උදාවෙන් එලඹෙන පළමු දවසෙන් එය ඇරඹේ. නව රාත්‍රී යන වචනයේ සංස්කෘතික තේරුම රාත්‍රී නවයක් යන්නය. මෙම රාත්‍රී නවය යෙදෙන දින දහයේදී විවිධ ස්වරූපයෙන් පෙනී සිටින පරාශක්ති දේව මෑණියන්ට වන්දනා කෙරේ.



එම විවිධ ස්වරූපයන් නම්,
1. දුර්ගා 2. භද්‍රකාලි
3. ජගදම්බා 4. අන්න පූර්ණා
5. සර්වමංගල 6. බහිරවී
7. චන්ද්‍රිකා 8. ලලිතා
9. බවානි

දහවෙනි දිනය සාමාන්‍යයෙන් සළකනු ලබන්නේ, විජය දසම් ලෙසය. මෙම දිනයේදී දේව මාතාව පෙනී සිටින්නේ, මහිෂාසුරමර්දනී නාමයෙන් ය.

පුරාණ වෘත්තාන්තයන්ට අනුව අසුරයින්ගේ රජ වශයෙන් සැලකෙන රම්බා මී හරකෙකු සමග ආලවන්ත සම්බන්ධයක් ඇති කර ගන්නට යෙදුනි. මේ ඇසුර නිසා උපන් මහිෂාසුරට හිමි වූයේ මනුෂ්‍ය ශරීරයකුත් මී හරක් හිසකුත්ය. මහිෂාසුර අතිශය බලවත් ආක්‍රමණශීලී අසුරු කෙනෙකු විය.

බලවත් වූ මහිෂාසුර වරෙක දේවාස් ව පරාජය කර ඔහුට හිරි හැර කරන්නට විය. මෙහිදී දේව ත්‍රිත්වය හෙවත්, බ්‍රහ්ම, විෂ්ණු, ඊශ්වර මේ යක්ෂයාව මරා දැමීමට තමන්ට උපකාර කරන ලෙස පරාශක්ති දේව මෑණියන්ගෙන් ඉල්ලා සිටියේය. එවිට දේව මාතාව දේවාස් ව මුදවා ගැනීම සඳහා දුර්ගා ගේ වේශයක් ගෙන ද්වන්ධ සටනකට එන ලෙස මහිෂාසුර ට අභියෝග කළේය. දින නමයක් පුරා පැවැති බිහිසුණු යුද්ධයෙන් පසව දහවෙනි දිනයේදී දුර්ගා ප්‍රබල මහිෂාසුරව මරා දැමුවා ය. එබැවින් නව රාත්‍රී උත්සවයේ දහවෙනි දිනය විජය දසම් ලෙස හඳුන්වන අතර, එය උත්සවාකාරයෙන් සමරන්නේ, අයහපත පරදවා යහපත ජයගත් බවේ සංකේතයක් ලෙසය. මේ නිසා දුර්ගා සළකනු ලබන්නේ මහිෂාසුරගේ විනාශකරු හෙවත් මහිෂාසුරමර්ධනී ලෙසය.

අපගේ ජිවිතයේ පිරිපුන් සාර්ථකත්වයක් ලැබීමට නම් අංග තුනක් කෙරෙහි සැළකිල්ල යොමු කිරීමට සිදුවේ. එනම් නිරෝගී බව, ධනය හා දැනුමයි. මෙය පෙන්නුම් කිරීම සඳහා නව රාත්‍රිය දින තුනේ කොටස් 03 කට වෙන් කර ඇත. මෙහි අරමුණ වන්නේ දුර්ගා, ලක්ෂ්මි හා සරස්වති යන විවිධ ස්වරූපයන්ගෙන් පෙනී සිටින උත්තම මාතාවන් ඒ ඒ දින වලදී වන්දනා කිරීමයි.

පළමු දින තුනේදී දේව මාතාව පෙනී සිටින්නේ දුර්ගා හෝ කාලි ලෙසය. බැතිමතුන් මේ දිනවලදී තමන්ට පැමිණෙන විපත්, දුරාචාරයන් හා අයහපත් දේ නැති කර ආශිර්වාදයක් ලබා දෙන ලෙස දේව මෑණියන්ගෙන් ඉල්ලා සිටී.

ඊළඟ දින තුනේදී දේවමෑණියන්ට නමස්කාර කරන්නේ, ලක්ෂ්මි දෙවිඳුව හැටියටය. ලක්ෂ්මි ධනයට අදිපති දෙවිඳු බැවින් විපුල සම්පත් හා සෞභාග්‍ය ඇගේ බැතිමතුන්ට ලබා දීමේ බලයක් ඇය සතුය.

අවසාන දින 3 දී දේව මෑණියන්ට වන්දනා කරන්නේ, දැනුමේ ප්‍රතිමූර්තියක් බඳු ශුවනට අදිපති සරස්වති දෙවිඳුන් ලෙසය. එබැවින් නව රාත්‍රී උත්සවයේ දී නව වන රාත්‍රියේදී සරස්වති පූජාව සිදු කරනු ලැබේ. ආයුධ පූජාව සිදු කරනු ලබන්නේ ඉන් අනතුරුවය. ආයුධ පූජාව යනු ආයුධ වලට වන්දනා කිරීමේ පූජා විධියකි. මෙහිදී ආයුධ වශයෙන් සළකනු ලබන්නේ, දැනුම හා අභිවෘද්ධිය ලබා දෙන පොත් පත් හා වෙනත් උපකරණ වලටය.

මේවා දෙවියන් ඉදිරියේ තැන්පත් කර ඒවාට දේවාශිර්වාදය ලබා ගෙන නැවදුරටත් ඒවා බලගතු කර ගැනීම මෙහි අරමුණයි.

නව රාත්‍රි උත්සවයේ තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ, කොලු (kolu) සැකසීමය. මේ අනුව වේදිකාවේ පඩි පෙළවල් තුනක්, පහක්, හතක් හෝ නවයක් සකස් කෙරෙන අතර, විවිධ සත්වයන්, දෙවියන්, දේවතාවන්ගේ අඹන ලද ප්‍රතිමා හෝ මූර්ති මෙම පඩි පෙළවල් වල තැන්පත් කෙරේ. මෙහිදී දෙවියන්ගේ ප්‍රතිමා ඉහළම පිය ගැට පෙළේ තබන අතර, අනෙකුත් අය අනුපිළිවෙළින් පහළ පඩි පෙළ වල තැන්පත් කෙරේ. සාමාන්‍යයෙන් ඉහළ සිට මෙම අනුපිළිවෙල වන්නේ,සෘෂිවරු (Rishi), දෙවිවරු, අසුර, මනුෂ්‍ය, සත්ව, ගස්, ගල්, ආදී වශයෙනි.

මෙය අපට සිහිපත් කර දෙන්නේ, ස්වර්ගය ලැබීමට පෙර අපගේ කර්ම චක්‍රය අනුව නැවත ඉපදීමට ඇති අවස්ථාවන්ය. නව රාත්‍රි යනු පූද පූජා පැවැත්වීමෙන් සමරනු ලබන උත්සවයක් පමණක් නොව එය සංස්කෘතික වැඩ සටහන් වලින් ද සමන්විත වූවකි. එහිදී ප්‍රසාදම් හැටියට සැලකෙන විවිධ රසකැවිලි බැතිමතුන් අතර බෙදා දීමක් ද සිදු කෙරේ.



සිංහල සැකසුම:
**ඩබ්. මිලන් ප්‍රනාන්දු විසිනි.**
**0112 611127**

# සිත මධ්‍යගත කිරීම.

අපි ජිවත් වන ලෝකය දෙස බලමු. එවිට එහි පැහැදිලි ස්වභාවයන් දෙකක් ඇති බව දැකිය හැකිය. භෞතිකව බැලුවත් මනෝමයව (මනසින්) බැලුවත් මෙම ස්වභාව දෙක පැහැදිලිව පෙනෙනු ඇත. උදාහරණ වශයෙන් හොඳ - නරක, කළු - සුදු, දිවා - රාත්‍රිය, අඳුර - එළිය යනුවෙනි. තවද ලෞකික හා ලෝකෝත්තර වශයෙන්ද පෙන්වා දිය හැක. බුදුරජාණන් වහන්සේ ද ප්‍රථම ධර්ම දේශනාවෙන් පස්වග මහණුන් උදෙසා ධම්ම චක්ක පවත්තන සූත්‍රයෙන් ද අන්ත දෙකක් ඇති බව දේශනා කළහ. එනම් කාම සුඛල්ලිකානුයෝගය සහ අත්තකිලමතානුයෝගය යනුවෙනි. ශරීරයට අධික ලෙස දුක් දීම අත්තකිලමතානු යෝගය යනුවෙන්ද, අධික ලෙස කම් සැප දීම, කාම සුඛල්ලිකානු යෝගය යනුවෙන් ද සාමාන්‍ය ව්‍යවහාරයේ පවතී. කච්චායන ගොත්ත සූත්‍රයෙන් ද අත්ථි නත්ථි ලෙස එනම්, ඇත, නැත යන ද්වි ස්වභාවය ගැන බුදුන් වහන්සේ දේශනා කර ඇත.

භෞතික ලෝකය මෙන්ම මනෝමය ලෝකයේ ද ස්වභාවයන් දෙකක් පවතින බව අපට පැහැදිලි වෙනවා. අප ජිවත් වන භෞතික ලෝකයේ ද්වි ස්වභාවය මෙලෙස දැක්විය හැකිය.

| භෞතික වශයෙන් | මනෝමය වශයෙන් |
|---|---|
| කන්ද - පල්ලම | රාග - විරාග |
| වියලි - තෙත | ද්වේශ - අද්වේශ |
| වර්ෂාව - නියගය | කැමැත්ත - අකැමැත්ත |
| කලු - සුදු | අශාව - නිරාශාව |
| චංචල - නිශ්චල | දුක - සැප |
| | ගඳ - සුවඳ |

බුදු දහමට අනුව ඉහත සඳහන් අරමුණු ගන්නා ද්වාර 5 ක් ඇත. එනම්, ඇස, කණ,නාසය, දිව, ශරීරය වශයෙනි. මේ අරමුණු සියල්ල දැනෙන්නේ සිතටයි. එසේ නම් මේවා සිතට දැනෙන අන්තයන් ය.

අප දැනුම හා අවබෝධය යනුවෙන් අදහස් කරන්නේ, කුමක්දැයි බලමු.

සමහරු දැනුම හා අවබෝධය යන මේ දෙකම එකක් ලෙස සලකති. එය එසේ නොවේ. මෙය දෙකකි. දැනුම හෙවත් බුද්ධිය ලබා ගන්නේ පොත පත සහ දේශනා ඇසුරිනි. පොත පත කියවීමෙන් සහ දේශනා ඇසීමෙන් බුද්ධිය හෙවත් දැනුම වර්ධනය වේ. මෙහිදී අප සෑම දෙයක්ම සංසන්ධනාත්මකව බැලීමට පුරුදුව ඇත. සංසන්ධනාත්මකව ලබා ගන්නා දැනුම සාපේක්ෂ වේ. දුක ඇත්තේ සැපට සාපේක්ෂවයි. ගඳ ඇත්තේ සුවඳට සාපේක්ෂවයි. එසේ නම් දැනුම වැඩෙන්නේ, තවත් දෙයකට සාපේක්ෂවයි. මෙසේ වර්ධනය වන දැනුම හෙවත් බුද්ධිය ලැබෙන්නේ අපගේ මොළයටයි. අප අසා තිබෙනවා ගුරුවරුන් සහ දෙමව්පියන් දරුවන්ට ''මොළයක් නැද්ද?'' කියා යමක් තේරුම් කර දෙන විට එය වටහා ගැනීමට අපහසු දරුවන්ට බනිනවා. ගුරුවරයා යමක් කියා දෙන විට ''සිතක් නැද්ද?'' කියා අසන්නේද නැත. ඔහු අසන්නේ ''මොළයක් නැද්ද?'' කියාය. එසේ නම් දැනුම සම්බන්ධ වන්නේ, මොළයට බව සහතිකය.

එසේ නම් සිතට දැනෙන්නේ කුමක්ද? කියා අපට ප්‍රශ්නයක් ඇති වේ. සිතට දැනෙන්නේ අවබෝධයයි. අවබෝධය සිත හා බැඳී පවතී. එය සාපේක්ෂතාවයෙන් තොර වූ දෙයකි. බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද ධම්ම චක්ක පවත්වන සූත්‍රයෙන් පැහැදිලි ලෙස දේශනා කර ඇත්තේ, සිත අන්ත දෙකට නොයවා මධ්‍යස්ථව තබා ගෙන ගවේශනය කළ යුතු බවය. එය මධ්‍යම ප්‍රතිපදාව ලෙස හඳුන්වා දී ඇත. අපි අන්තයකට ගිය පසු අනෙක් අන්තය පැහැදිලිව නොපෙනේ. නමුත් මධ්‍යස්ථව සිත තබා ගෙන ප්‍රඥාවෙන් ගවේශනය හෝ විමර්ශනය කරන විට අවබෝධය ලැබේ. එනම් අන්තයන්ගේ ඇති බාධා හොඳින් අවබෝධ වේ. උදාහරණයක් වශයෙන් අප මුහුදු වෙරළට ගොස් එක් පැත්තකින් මහා සමුද්‍රය දෙස බලන විට ක්ෂිතිජය ද අනෙක් පසින් ගොඩ බිම ද පෙනේ. ක්ෂිතිජය මිරිගුවක් බව අපට අවබෝධ වේ. ගොඩ බිම දෙස බැලුවත් එක් අතක කඳු පල්ලම් ජලාශ තැනිතලා ආදිය ඇති බව පෙනේ. මේ සියල්ල බාධාවන් බව අප සිතට අවබෝධ වේ. එම නිසා සිත මධ්‍යස්ථ ගත කළ විට එම අන්ත දෙකේ ඇති යථා ස්වභාවයන් හොඳින් පෙනේ. මෙසේ අප සිත තුළට මධ්‍යස්ථව සිට එබී බැලුවහොත් සසරේ ඇති අනිත්‍යභාවය අවබෝධ වේ. කිසිම අන්තයකට හෝ බැඳීමක් කර ගත නොයුතුය. එසේ නම් බුදුන් වහන්සේ දේශනා කරන ලද නිවනට ඇති මාර්ගය ඇත්තේ අප තුළමය. සිතෙහි ඇති වන සිතිවිලි ධාරාවන්ගේ සත්‍ය අසත්‍යතාවය මධ්‍යස්ථව සිට අවබෝධ කර ගන්නා තැනැත්තා සංසාරය ජය ගනී. එසේ නම් අවබෝධ ඥාණය සාපේක්ෂ නොවේ. උදාහරණයක් වශයෙන් අප යම් කිසි විමර්ශනයක් කිරීමේදී ප්‍රථමයෙන්ම යම්කිසි අන්තයකට නැමී පර්යේෂණය හෝ විමර්ශනය කළ හොත් එහි ප්‍රතිඵල නිවැරදි නොවිය හැකිය. එය එසේ වන්නේ, අන්තයකට බරව විමර්ශනය හෝ ගවේශනය කළ බැවිනි. සිත මධ්‍යස්ථව තබා ගෙන විමර්ශනය ගවේශනය කළහොත් ප්‍රතිඵලය නිවැරදි විය හැකිය.

තවත් උදාහරණයක් ගතහොත් යම් පුද්ගලයෙක් තම දාසියක් ලවා එකම භෝජනයක් සාදා ගෙන අනුභව කරන්නේ නම්, එවිට පළමු දවසේ එය ඉතාම හොඳ, ඉතාම රස බව හැඟේ. දෙවැනි දිනයේ එම භෝජනය රස බව දැනේ. තෙවැනි දිනයේ දී ටිකක් හොඳ බව ද, ඊළඟ දිනයේ දී එතරම් හොඳ නැති බව ද සිතයි. නමුත් අවසාන දිනයේදී ඔහු කුසගින්නේ ඉන්නා හිඟන්නෙකුට එම භෝජනය දෙයි. එවිට එය හිඟන්නාට ඉතාම හොඳ භෝජනයක් වේ. නමුත් පෙර කී පුද්ගලයාට එය හොඳ නැති බව සිතයි. එසේනම් මෙතන වී ඇත්තේ කුමක්ද? එකම භෝජනය දෙවිදියකට රස දැනෙන්නේ, භෝජනයේ වරදක් නිසා නොව සිතේ ඇති වෙනස නිසාය.එසේ නම් හැම දෙයකටම මනස හෙවත් සිත ප්‍රධාන වෙයි.

'' මනෝ පුබ්බංගමා ධම්මා
මනො සෙට්ඨා මනොමයා
මනසා චෙ පදුට්ඨේන....''

යනුවෙන් සෑම දෙයටම සිත ප්‍රධාන බව බුදුන් වහන්සේ දේශනා කර ඇත. මෙය ධම්ම පදයේ ''යමක වර්ගයේ'' පළමුවැනි ගාථාවය. මෙහි අර්ථය පහත සඳහන් පරිදිය.

වේදනා, සඤ්ඤා, සංස්කාර යන ස්කන්ධත්‍රයට අයත් වූ ධර්ම සංඛ්‍යාත චෛතසිකයෝ සිත හෙවත් විඤ්ඤාණය පෙරටු කොට ඇත්තාහ. සිත උතුම් කොට ඇත්තාහ. සිතෙන්ම උපදනාහ. (ජේතවනයේදී චක්ඛුපාල තෙරුන් අරඹයා දේශනා කරන ලදී.)

මෙසේ සිත ප්‍රධාන වන බැවින් ''මම'' යන පුද්ගලයා විමර්ශනය කිරීමේදී සිත මධ්‍යස්ථව තබා ගත යුතුය. එනම් අන්ත දෙකට යා නොයුතුය. බුදු රජාණන් වහන්සේ විඳීම් (කාමසුඛල්ලිකානු යෝගය) සහ නොවිඳීම් (අත්තකිලමතානුයෝගය) යන අන්ත දෙක අත්හල යුතු බව දේශනා කරන ලදහ. මධ්‍යම ප්‍රතිපදාව තුළින් එනම් සිත මධ්‍යගත කිරීමෙන් අවබෝධ ඥාණයෙන් බුද්ධත්වයට පත් විය. මේ මධ්‍යම ප්‍රතිපදාව තවත් ගැඹුරු ලෙස පරිශීලනය කළ යුතුව ඇත. මෙම ලිපියෙන් යම් තරමක් හෝ සිත අවධි කර ගත හැකි වූවේ නම්, මගේ උත්සාහය යම් සාර්ථකත්වයක් ඇති වූවායැයි මම සිතමි. ධර්ම දානය ලොව ඇති උතුම් දානය යැයි, බුදුන් වහන්සේ වදාල සේක.



ජයලාල් ජයවර්ධන
0777 412289

# බුදුබණ ඇසීම කියවීම අපට වැදගත්වන්නේ ඇයි ?

පළමුවෙන් අපි මෙහි ඇති වැදගත්කම ගැන මොහොතක් සිතමු. අද සමාජයේ බොහෝ දෙනෙක් හැඩගැසී ඇත්තේ මුදල් පසුපස හඹායාමටයි. එනම්, මෙම මුදල් හොඳින් හෝ නරකින් හම්බකිරීමයි. මෙම මුදල් ඔබේ ගිණුමට බැරවූවාට පසු මෙම මුදල් වෙන්කර දැකිය නොහැක. එහෙත් බුද්ධ දේශනාවේ පෙන්වා ඇත්තේ මෙම මුදල් හරිහම්බ කළයුතු බවය. එනම් පස් පවින් වැලකී කළ යුතුය. පුහුදුන් ලෝකයේ බොහෝ දෙනෙක් මේ ගැන සිතන්නේ නැත. සමහර අයට මේ ගැන සිතන්න වෙලාවක් නැත. හිතන්න ඕනකමක් නැත. අඩුතරමින් මේවා ගැන හිතන්න හිතෙන්නේවත් නැත. මෙහෙම වෙනකොට කොහොමද අපේ අඩුපාඩු හදාගන්නේ. මෙන්න මේ නිසා තමයි අපට බුදුබණ අවශ්‍ය වන්නේ. රහත් වෙනතුරු නිවන්දකින තුරු මිනිසුන් ගේ සිත් තුළ කෙලෙස් තිබෙනවා. පුහුදුන් පුද්ගලයෝ පෘතග්ජන පුද්ගලයෝ වාගේ නම් වලින් හඳුන්වන්නේ මේ උදවියයි. බොහොම කෙලෙස් මතුපිටට පෙනෙන්නේ නෑ. තමා තුළ මෙවැනි කෙලෙස් තිබෙනවාද කියා තමාවත් දන්නේ නෑ. ඒවා තිබෙන්නේ හිත පතුලේ හැංගිලා තැන්පත් වෙලා. හැබැයි ඒවාට ගැලපෙන අරමුණක් අරමුණු වුන ගමන්ම ඒ කෙලෙස් මතුවෙනවා. උඩට එනවා. ප්‍රදර්ශනය වෙනවා. සමහර පුද්ගලයන් අතින් වරදක් වුනාම සමහරු කියනවා මමත් ඒ ගැන වැඩිය සිතුවේ නැති බව. එහෙත් සිදුවෙලා තිබෙන්නේ විශාල වරදක් බව පසුවයි වැටහෙන්නේ. සමහරවිට මෙවැනි පුද්ගලයෙක් යම්කිසි මත්වර්ගයක් පාවිච්චි කර සිටියහොත් ඔහුට යම්කිසි නොගැළපෙන දෙයක් අරමුණු වුවහොත් ඔහුගේ ඇගේ ලේ රත්වෙනවා. හෘදයේ ස්පන්දනය වැඩි වෙනවා. තමුන්ට තමුන් පාලනය කරගැනීමට නොහැකි වෙනවා. අපි තුළ තැන්පත් වී සිටින යක්කු, ප්‍රේත, කුම්භාණ්ඩ වශයෙන් නම් කළ කෙලෙස් ඉදිරියට එනවා. සමහරවිට වසර ගණනාවක් එකට සිටියත් පුද්ගලයෙක් හඳුනාගැනීමට අපහසුයි. සමහරවිට ස්වාමියා අතින් බිරිඳත්, බිරිඳ අතින් ස්වාමියාත් ඝාතනයවුණු අවස්ථා අපි අහලා තියෙනවා. මෙයට හේතුව අපි සා තුළත් තිබෙන ඉහත දක්වා ඇති ක්ලේශවල ඇති භයානකකමයි. ඒ නිසා තමයි හිත පාලනය කරගැනීම ඉතා වැදගත් වන්නේ. සිත ගැන ටිකක් ගැඹුරින් සිතා බලනකළ පළමුව සිතේ ඇතිවන්නේ සිතුවිල්ලකි. පසුව එය වචනය බවට පත්වෙනවා. ඊටපසු එය ක්‍රියාවක් බවට පත්වෙනවා. පසුව එය ඔහුගේ ජීවිතය බවට පත්වෙනවා. මේ ලෝකයේ තිබෙන ඉතාමත්ම ආශ්චර්යමත් වස්තුව තමයි හිත. මිනිසාගේ හිත තරම් අපූර්ව ආශ්චර්යමත් වස්තුවක් නාම මේ ලෝකේ පහළ වෙලා නැහැ. ඒ අපූරු හිත හොඳ පැත්තට යොමුකරගතහොත් ලැබෙන ප්‍රතිඵලය ඉතා හොඳයි. නරක පැත්තට යොමුකර ගතහොත් ලැබෙන ප්‍රතිඵලය නරකයි. මේ නිසා බුදුදහමේ ඉගැන්වෙන ඉන්ද්‍රිය දමනය සහ චිත්ත පාරිශුද්ධිය ඉතා වැදගත් වෙනවා. මේ බව මේ ගාථා ධර්මයෙන් මනාව පැහැදිලි වෙනවා.

**ඉන්ද්‍රියානි මනුසසාච - හිතාය අහිතායච**
**අරක්ඛිතානි අහිතාය - රක්ඛිතානි හිතායච**

මේ හිත ක්‍රියාත්මකවීමට කය අවශ්‍ය වෙනවා. සිත, කය, වචනය කියන තුන්දොර සංවර කරගැනීම තමයි අපට වැදගත් වන්නේ, මේ තුනෙන්ම කර්මය රැස්කර ගන්නවා. එනම් පිං පව් කරගන්නවා. මේ තුන්දොර තිබෙන්නේ අප තුළමය. එහෙමනම් ඒවා සංවරකර ගතයුත්තේත් අපමයි. මේ ගැන මොහොතක් සිතන්න. සිතමින් ජීවත්වන්න. විදර්ශනා නුවණින් දකින්න. එවිට ඔබට වැටහෙයි මේ හිතේ තිබෙන බලවත්කම හෝ දුබලකම. ලැජ්ජාව, භය හිතට ආභරණයකි. මේ නිසා හිත බොහෝදුරට පාලනය වී පවතී. ලෝක වජ්ජය සහ පන්නත්ති වජ්ජය යනු පෙර පැවති නීතියකි. මේ නිසා මිනිසුන් පව් කිරීමට බිය වෙයි. ලෝක නීතිය යනු පන්සිල්, අටසිල් සහ සාරධර්මය. පන්නත්ති වජ්ජය යනු පනවපු නීතින් ය. මේවා කාලානුරූපව වෙනස් වෙයි. එල්ලුම්ගස නිසා මිනිසුන් මැරීමට බියවන්නේ මේ නිසාය. හිතට අයාලේ යාමට නොදී යම් යම් බන්දන වලින් හිත බැඳ තැබිය යුතුය. සිත නිතරම පවතින්නේ සිතුවිලි සමගින්ය. එනම් රාග, ද්වේෂ, මෝහ යන මේවා විවිධ මුහුණුවරින් එළියට එනවා ඇත. මේ මගේ සිතට එන්නේ මොනවාගේ සිතුවිලි ද කියා තමාවත් දන්නේ නැත. යම් පුද්ගලයෙක් තුළ කාමරාගය තිබෙනවා කියා සිතමු. මේ කාමරාගය බොහෝදුරට යටපත්වෙලයි තිබෙන්නේ. හැබැයි පුරුෂ පක්ෂයට ස්ත්‍රී පක්ෂයත්, ස්ත්‍රී පක්ෂයට පුරුෂ පක්ෂයත් අරමුණ වීමෙන් කාම රාගය මතුවෙනවා. සමහරවිට මෙය අනුකම්පාව,

කරුණාව, දයාව වැනි මුහුණුවරින් තමයි එළියට එන්නේ. මේ නිසා බොහෝදෙනෙක් තමන් නොදැනීම ඔහු හෝ ඇයගේ ජීවිතවලට කිට්ටු වෙනවා. ඔහු හෝ ඇය කෙරෙහි දැඩි ලෙස පැහැදෙනවා. ආශා කරනවා. එහෙත් තමන් දන්නේ නැහැ මේ හිස ඔසවන්න හදන්නේ කාමරාගය නැමැති ක්ලෙශ ධර්මය බව. එහෙත් නිවැරදි පුද්ගලයා බුදුබණට සිත යොමුකරවලා මේ ක්ලේශ ධර්ම යටපත් කරනවා. මෙතනදී මනෝ කර්මය බලවත් වුවහොත් ඊලගට ඇතිවන්නේ ඊර්සියාව, වෛරය, ක්‍රෝධය වැනි අකුශල චෛතසික මාලාවක්. මෙහිදී තමන්ගේ සිතට නැගෙන කාමරාග අරමුණට විරුද්ධවන ඕනෑම කෙනෙක් විනාශ කිරීමට පවා පෙළඹෙනවා. බලන්න, නියපිටින් කඩන්නට තිබුණ දෙය අවසානයේ තමන්ගේ ජීවිතයෙන් පවා වන්දි ගෙවීමෙන් අවසන් වන හැටි. මෙන්න මේවාට තමයි බුදුබණ අපට අවශ්‍යවන්නේ. තමා හොඳ දෙයක් වැපුරුවහොත් ලැබෙන්නේ හොඳ ප්‍රතිඵලයක් බවත්, නරක දෙයක් වැපුරුවහොත් ලැබෙන ප්‍රතිඵලය නරක බවත් බුදුහාමුදුරුවෝ මේ ගාථාවෙන් දේශනා කරලා තිබෙනවා. එනම්,

**යාදිසං වපතෙ බීජං - තාදිසං හරතෙ ඵලං**<br>
**කල්‍යාණකාරී කල්‍යාණං - පාපකාරීච පාපකම්**

කෙසේ වෙතත් යෝනිසෝ මනසිකාරයෙන් යුතුව යහපත් සිතුවිලි සමගින් ජීවිතය හැඩගස්වාගන්න. ඔබට සම්මා සම්බුදු සරණයි !




**දයාවංශ දිසානායක (3312)**

**077 3462403**

**033 2226352**


## රේමන්ඩ් මහතාට පිළිතුරක්

''**කර්මය ගැනවූ ලිපියට පිළිතුරක්**'' යනුවෙන් පසු ගිය කලාපයේ ඩබ්. ඩී. රේමන්ඩ් මහතා විසින් පළකරන ලද ලිපියෙන් කර්මය සැබැවින්ම ක්‍රියාත්මක වන්නේද? යන සැකය මතු කර ඇත.

ලෝකයේ නියාම ධර්ම 5ක් පවති. කර්ම නියාමය ඉන් එකකි. නියාමයක් නම් මොන ක්‍රමයකින් වත් වෙනස් කරන්න බැරි විය යුතුයි.

1 උතු නියාමය :- ලෝකයේ ජලය, ගින්දර, වායුව, පස්, යන සතර මහා ධාතූන්ගෙන් යමක් හටගත්තානම්, එය වෙනස් වෙමින් ගොස් විනාශ වී යයි.

2 බීජ නියාමය :- ආර්ය විනයේ බීජ නියාමය කියන්නේ, කර්ම බීජ වලටයි. ගස් වැල් වල ඇට හෝ අංකුරානු බිම්බානු වලට නොවන අතර කර්ම බීජය අනුව නැවත උපත ලබනවා.


3 ධර්ම නියාමය :- හේතුව යම් සේද ඵලය ඊට අනුකූලව දරයි. අවිජ්ජා පච්චයා සංඛාරා යනුවෙන් පටිච්ච සමුප්පාද සිද්ධාන්තයක් වේද එය ධර්ම නියාමයකි. එනම් කැමැත්තෙන් බැඳුනු ආකාරයට උපත සිදුවේ.

4 කර්ම නියාමය :- පාප කර්මයක් කළොත් එය කවදාවත් පුණ්‍ය කර්මයක් වන්නේනෑ. මව හෝ පියා මැරීම අනන්තරිය පාපකර්මයක්. අපායගත වනවාමයි. අපාය 4ක් තියෙනවා. තිරිසන්, ප්‍රේත ,අසුර, නිරය යනුවෙන්. සිත, කය සහ වචනය මුල් කර ගෙන පාප කර්ම සිදුවෙනවා. ඉනුත් ප්‍රධාන වන්නේ, සිතයි. '' චේතනාහං භික්ඛවේ කම්මං වදාමි''

5 චිත්ත නියාමය :- රාග අරමුණු මුල්කොට රාග සිතක් හට ගන්නවා. ඒ ආකාරයෙන්ම ලෝභ සිත් හා මෝහ සිත්ද හට ගන්නවා. හොඳ නරක නොදැන ක්‍රියා කිරීම යනු අකුසල මූලයක් වන මෝහ සිතින් කරන ක්‍රියාවකි. මිනිසා පෙර අත්බැව්හි කරන ලද පහත්ක්‍රියා නිසා තිරිසන් උපතක් ලබා සිටී නම්, එම සතා හොඳ නරක නොතේරෙන තත්වයට පත්වී ඇත්තේ, කර්ම නියාමයට අනුවමය. කර්ම ශක්තිය ගෙවී යන තුරු විඳවීමට සිදුවේ. විඤ්ඤාණයක් හට ගැනීමට චිත්තක්ෂණ 17 ක් පසු වෙනවා. එය සර්වඥගෝචර දහමක්.

ලෝකය හට ගෙන තිබෙන්නේ, මෙම නියාම ධර්ම වලින්, මෙම නියාම ධර්ම අචින්ත්‍යයි. සිත දියුණු කලොත් අවබෝධ කර ගත හැකියි. අප විසින්ම ගොඩ නගා ගත් වැඩ පිළිවෙළකින් ඒ සිද්ධාන්තයට අනුකූල වූ පරිසරයක තමයි අපි සකස් වෙලා ඉන්නේ. ''ස්ව කියන තමා විසින් ම භාව ශක්තියක් ගොඩ නගා ඊට අනුකූලව දරණ මේ වැඩ පිළිවෙල ස්වභාව ධර්මයයි.

ලෝකයේ පවත්නා සෑම ආගමක් ම සහ දර්ශනයක් ම දෘෂ්ටීන් 3 කට බෙදනවා. ආත්මයක් ඇත යන ශාස්වත වාදය, ආත්මයක් නැත මරණින් සියල්ල අවසන් වේය යන උච්ඡේද වාදය, මේ දෙකම වැරදිය යන මතය විභජ්ජවාදය නොහොත් බෞද්ධ දර්ශනයයි. ඒ අනුව ආත්මාර්ථකාමීත්වය යනු ආත්මය සාරයි යන අවිද්‍යා, තෘෂ්ණා අකුසලමූල වල පිහිටා ශාශ්වත දෘෂ්ටියෙන් එළඹෙන නිගමනයකි. මෙය විඤ්ඤාණය හෙවත් විඤ්ඤාණ ඥාණ දැක්මකි. එය යතාර්ථය නොවන අතර මායාවකි. ප්‍රඥාව හෙවත් ප්‍රකෘති ඥාණය උදා කර ගැනීමට පංච ඉන්ද්‍රියන් උපකාර වේ. එනම්, සද්ධා, විරිය, සති, සමාධි, ප්‍රඥා යනුවෙනි.




**එල්. මහින්ද රත්න - 3069**

**0112 236065**

# කර්මය කුමක්ද?

"**සඳෑව**" 2014 ජනවාරි/ මාර්තු කලාපයට ඩබ්. ඩී. ඒ. රේමන්ඩ් මහතා සැපයූ ලිපියත් 2014 අගෝස්තු/ සැප්තැම්බර් කලාපයට ටී. ඒ. පී. ගෝමිස් මහතා සැපයූ ලිපියත් කියවීමෙන් පසුව මගේ අදහස් ද මෙසේ ලියමි.

ඉන්දියාවේ පහළ වූ හින්දු දහම, ජෛන දහම, බුදු දහම හා සික් දහම පොදුවේ දරණ මතය වනුයේ එක් එක් පුද්ගලයා ඔහු විසින් පෙර භවයෙහි කරන ලද ක්‍රියා හෙවත් කර්මයන් අනුව ඔහු මේ ලෝකයේ උපත ලබන බවයි. මිනිසාගේ ඉතා ඉහළ අවසානය තමන් එසේ යලි යලි ඉපදීමේ චක්‍රය නතර කරවීම බව එම ආගම් වල අවධාරණය කෙරේ.

එහෙත් බයිබල් දේශයන්හි (ඉරානය, ඉරාකය, ජෝර්දානය, ඊශ්‍රායලය, ලෙබනන්, හා මධ්‍යධරණී මුහුදු ප්‍රදේශය) ඇතිවූ යුදෙව් දහම, ශරතුස්ත්‍ර දහම, කිතු දහම හා ඉස්ලාම් දහම යන ආගම්වල 'නිර්මාපකයෙකු' (Creator) ගැන බලවත් මූලික විශ්වාසයක් ඇත. ''කාලය සහ අවකාශය'' (Tima and Space) සහිත සැබෑ වශයෙන් පවත්නා ලෝකයක විසීම සඳහා උන්වහන්සේ මිනිසා නිර්මාණය කොට ඇති බවත්, ඔහු එම කාලය තුළ විශ්වාස කරන හා කටයුතු කරන ආකාරය අනුව නියතවූ ''තෑගයක්'' (Reward) හෝ ''දඬුවමක්'' (Punisment) අවසානයේ ඔහුට උරුම වන බව මෙම ආගම් වලින් ප්‍රකාශ වේ. තවද නැගෙනහිර ආසියාවේ ප්‍රධාන ආගම් වශයෙන් සලකන චීන ටාඕ දහම, කොන්ෆියුසියස් දහම සහ ජපන් සින්ටෝ දහම ගත් විට එම ආගම් වලද, ''කාලය සහ අවකාශය'' සහිත පියවි ලෝකයේ වැදගත්කම පොදුවේ අවධාරණය කෙරේ. එම ආගම්වල සොබාදහම සහ මළගිය මුතුන්මිත්තන් ඇදහීම හා වන්දනා කිරීම ප්‍රධාන කොට සැළකේ.

සොබාදහම තුළ කර්මයක් ක්‍රියාත්මක වන බවක් දක්නට නොලැබේ. අහස, පොළොව, මුහුද, ජීවීන්, ගස්වැල් ගංගා, දිය ඇලි වැනි නිර්මාණයන් සොබා දහම වන අතර ''කර්මය'' වශයෙන් දැක්විය හැක්කේ ජීවීන්ගේ පැවැත්මට අනුකූලව ක්‍රියා කරන බල වේගයක් බවයි.


ඉන්දියාවේ පහල වූ ආගම් මගින් පෙන්වා දෙන්නේ පුද්ගලයා ඉපදෙමින් මිය යමින් සංසාරයේ සැරිසරන බවත්, සිතින් කයින් කරන කටයුතු (කර්මය) අනුව ඉදිරි ජන්මයේ දී විපාක දෙන බවත්ය. විශ්වයේ අනන්ත අප්‍රමාණ ලෝකධාතු ඇතැයි ද, එය පරතෙරක් දැකිය නොහැකි මුල සහ අග සෙවිය නොහැකි දෙයක් බවද දැක්වේ.විශ්වය විවිධ භෞතික දේ වලින් සැදී ඇත. විශ්වයේ අංශුවක් වූ ලෝකය ද එම ද්‍රව්‍ය වලින් සැදී තිබේ. එම ප්‍රකෘතියට මිනිසා ද එක්වේ. විශ්වය සහ ලෝකය යන දෙකම පවතින නමුත් ඒවා අනිත්‍යය. පුද්ගලයා තම තෘෂ්ණාව නිසා එයට බැඳී ඇත. සැප කියන්නාවූ යම් සුවයක් ලබා දෙන දේ ලෝකයේ ඇත. ඔහු ඊට බැඳෙන්නේ ඒ නිසාය. ඒවා ස්ථාවර දේ නොව ඉතා තාවකාලිකය. එම නිසා ඒවා තමන්ට අහිමි වන විට පුද්ගලයා දුකට පත්වේ. එබැවින් මිනිසා මේ සියල්ලෙන් මිදී සැබෑ සුවය අත්විඳිය හැක්කේ නැවත ඉපදීමක් හෝ දුක සැප වැනි කිසිදු වින්දනයක් නැති ''නිර්වාණය'' සාක්ෂාත් කර ගැනීමෙනි.

ගෝමිස් මහතා දැක්වූ පරිදි (කර්මයේ) පාපයේ ආරම්භය ලෝකයේ පටන් ගැන්මට පසුව ඇති වූවකි. කිතු දහමේ ධර්ම ග්‍රන්ථය වූ බයිබලය දක්වන පරිදි විශ්වය නිර්මාණයෙන් පසුව පළමු මනුෂ්‍යයා වූ ''ආදම්'' දූවිල්ලෙන් සාදනු ලැබුවේය. ඔහුට තනිව ජීවත් වන්නට නොහැකි බව පෙනුනු ලෝකයේ නිර්මාණකරු විසින් ආදම්ගේ ඉළඇටයකින් ''ඒවා'' (ජීවමාන සියල්ලන්ගේ මව) සාදන ලදී. මැවුම්කරුගේ වචනයට අකීකරු වූ බැවින් ඔවුන් පාපයට වැටින. එහි දඬුවම වශයෙන් මරණය, දුක, ශෝකය, ලෝකයට, උරුම විය. එබැවින් ලෝකයේ උත්පත්තිය ලබන සෑම (ජීවියකුටම) මනුෂ්‍යකුටම එහි විපාක විඳීමට සිදුව තිබේ.

එක් පරම්පරාවක් කරන වැරදි ක්‍රියා වල විපාක ඉදිරි පරම්පරාවල් කීපයක් (පරම්පරා 4ක්) දක්වා විඳිදී යයි. එසේම තවත් පරම්පරාවක හොඳ ක්‍රියා වෙනුවෙන් ඉදිරි පරම්පරා බෝහෝ ගණනක් (දහස් ගණනක්) යහපත් විපාක වලට හිමිකම් ලබත්. සමහර සුව කිරීමට අපහසු රෝග වලට හේතුව ද (පිළිකා, දියවැඩියා වැනි රෝග) මෙම පරම්පරා පාප බව උදාහරණ වශයෙන් දැක්විය හැක. ක්‍රිස්තු ධර්මයට අනුව පාපයේ කුලී නම් මරණයයි.

පොළොවේ ස්වභාවික නිර්මාණය මනුෂ්‍යයා විසින් විසින් කරන විනාශයන් සමග නායයෑම්, කඳු කඩා වැටීම් වැනි පුවත් අසන්නට ලැබේ. ගස්වැල් විනාශ කිරීම නියගය ඇති කිරීමටත් ඒ අනුව ජල උල්පත් සිඳී යාම හා ගොවිතැන් හවබෝග විනාශ වීමටත් හේතුවේ. මනුෂ්‍යයාගේ නොමනා ක්‍රියාකාරකම් නිසා සිදුවන විනාශයන් කර්මයට බාර කළ හැකිද? හැම දෙයක්ම සිදු වන්නේ කර්මය නිසා බව කීමට බොදු දහම, හින්දු දහම, අදහන බොහෝ දෙනෙක් පුරුදුව සිටිති. සියල්ල කර්මයට බාරදී සිත සනසා ගනිති.කුඩුවක ඇති දැඩි වී මරණයට යන කුකුලන් මෙන් බොහෝ මනුෂ්‍යයෝ තමාට පුරුදු ස්ථානයේ හිරවී සිටිති. ලෝකය ගැන දැන ගන්නටත්, අධ්‍යනය කරන්නටත් මැලිවෙති. (කුඩුවේ ඇති දැඩි වූ කුකුලන් එයින් මුදා හැරියත් එම ස්ථානය හැර නොයති) එබැවින් ලෝකයේ යථාර්ථය දැකීමට නොහැකිව ජීවිතය ගෙවා දමති. කර්මය  යන සංකල්පයේ කොටු වූ මනුෂ්‍යයාද එයින් ඔබ්බට ඇති දේ නොසොයා සියල්ල කර්මයෙන් සිදුවන බවට තීන්දු කරනු ලබයි. එබැවින් මෙම මාතෘකාව අපට තර්කානුකූලව අළුත් මත යන් දැන ගැනීමට මග පාදා ඇත.

කර්මය ගැන අදහසක් දැක්වීමට මග පෑදූ ඩබ්. ඩී. ඒ. රේමන්ඩ් මහතාටත් ටී. ඒ. පී. ගෝමිස් මහතාටත් ස්තූති වන්ත වෙමි.




**ශ්‍රියා කංකානම්ගේ**

**0112 852574**

**072 6726510**

# කර්ම සංකල්පය - අවසාන කතාව

සැදෑව 2014 ඔක්තෝම්බර්, දෙසැම්බර් කලාපයේ පළවූ කර්මය ගැන පිළිතුරට පිළිතුරක් යන ලිපිය හා බැඳෙයි. 2014 අගෝස්තු සැප්තැම්බර් කලාපයේ සටහන් වූ මාගේ ලිපියේ, එම ලිපිය රේමන්ඩ් මහතාගේ පළමු ලිපියට පිළිතුරක් හෝ විවේචනයක් හෝ නොවන බැව් ඉතා පැහැදිලිව සටහන් කර ඇත. (පළමු ඡේදය) මාගේ අභිප්‍රාය වූයේ කර්මය හා ස්වභාව ධර්මය පටලවා ගත් රේමන්ඩ් මහතාගේ මතවාදය විශ්‍රාමිකයා තුළ ජනිත කරවන ව්‍යාකූලත්වයෙන් විශ්‍රාමිකයා නිදහස් කර ගැනීමයි. (දෙවන ඡේදය) මතවාදයකට පිවිස එම මතය තහවුරු කිරීමට කරුණු සෙවීම මාගේ අභිප්‍රාය නොවේ.

මාගේ පළමු ලිපිය සංවාදයකට විවෘත නැතැයි සඳහන් කර තිබුණ ද, යම් කිසි ප්‍රමාදයකින් එසේ සඳහන් වී නොතිබුණි.

මා කථා කරන්නේ, කර්මය ගැන නොව කර්ම සංකල්පය ගැනයි. එනම් කර්ම නැමැති ඉගැන්වීම නිසා අප එකිනෙකා තුළ නිර්මාණය වී ඇති කල්පනා සහ අදහස් ගැනයි. බුදු දහමට අනුව ' කර්මය' සම්මා සම්බුදුවරයින්ට පමණක් පිරිසිඳ (කිසිවක් නොඅඩුව තබා) දත හැකි විෂයකි.

කරුණු මෙසේ වුවද මා ප්‍රිය මිත්‍ර රේමන්ඩ් මහතා අවසන් වරට යළිත් අමතමි. ලිපියේ අංක 01 බලන්න. '-සත්ත්වයා ස්වභාවයෙන්ම ආත්මාර්ථකාමී බැවින්ද', එසේ වීමට සලසා ඇත්තේ සොබා දහම බැවින්ද-' මෙහි දෙවන අදහස සාවද්‍ය බැව් අවධාරණය කරමි. මාගේ පළමු ලිපියෙන්ද මෙය පෙන්වා දී තිබුණි. සත්වයා ආත්මාර්ථකාමී වීමට සලස්වන්නේ සත්වයන්ගේ ස්වභාවය මිස සොබා දහම නොවේ. සොබා දහම හා ස්වභාවය අප වෙන්ව හඳුනා ගත යුතුය. උදාහරණයක් ගනිමු. මිහිරි ඵල හට ගැන්වීම අඹ ගසක ස්වභාවයයි. මාරාන්තික ඵල හට ගැන්වීම කනේරු ගසක ස්වභාවයයි. මෙය ස්වභාව ධර්මයේ ලක්ෂණයක් නොවේ. එය ඒ ඒ ගස් වල ස්වභාවයයි. ස්වභාව දහම කර්මය මඟින් සත්වයාට දඬුවම් කරයි ද? මේ මගේ මිත්‍රයාගේ අනෙක් ප්‍රශ්නයයි. මා පෙර කීවා සේම සොබා දහම කර්මය මඟින් කිසි කෙනෙකුට දඬුවම් කරන්නේ ද නැත. එසේ කරන්නේ නම්, කර්මය සොබා දහමේ අවියක් විය යුතුය. ස්වාධීන බලවේගයක් වන කර්මය තනිව කටයුතු කරයි. බුදුවරුන්ගේ විෂයයක් වූ කර්මය නියත වශයෙන්ම ක්‍රියාත්මක වන්නේ ද, සහ එහි විපාක දීමේ ක්‍රමවේදය මෙසේ යැයිද සහතික වීමට තරම් මම ප්‍රඥාවන්ත නොවෙමි.

ලිපියේ අංක 2 බලන්න. හොඳ නරක නොදැන කරන කර්ම සඳහා විපාක නොදෙන බැව් බුදු දහම මෙන්ම කිතු දහම ද පවසා ඇති ආකාරය මගේ පළමු ලිපියේ සඳහන් කළෙමි. එසේ නොවන්නේ නම් එය අසාධාරණ බැව් සැබෑය. ක්‍රිස්තු හා ඉස්ලාම් ධර්ම කර්ම සංකල්පය විශ්වාස කරන බවට මා ඉදිරිපත් කළ සාක්ෂි දුර්වල යැයි රේමන්ඩ් මහතා කියයි. මා ඉදිරිපත් කළේ කවුරුත් දන්නා එක් සරල සාක්ෂියක් පමණි. කෝරානයෙන් කෙසේ වෙතත් බයිබලයෙන් මට තවත් සාක්ෂි ඉදිරිපත් කළ හැකිය. එහෙත් මා එසේ නොකරන්නේ, මා දුන් එකම සරළ සාක්ෂියට විරූපි අර්ථ ගැන්වීමක් කිරීමට රේමන්ඩ් මහතා ගෙන ඇති ආකාරුණික උත්සාහය නිසාවෙනි.' නුඹ වපුරන්නේ යමක්ද එයම කපා ගනී' යන දේශනා පාඨයෙන් ක්‍රිස්තුස් වහන්සේ උත්සාහ කළ පමණට ඵල ලබා ගත හැකි යයි අදහස් කළ බැව් රේමන්ඩ් මහතා අනුමාන කරයි. මෙයින් පැහැදිලි වන්නේ, මාගේ මිත්‍රයා සත්‍ය සෙවීම පිණිස සිය මතවාදයෙන් මඳකට හෝ බැහැරවීමට අකමැති බවයි. තම මතවාදය රැක ගැනීම පිණිස සාමාන්‍ය ජනී ජනයා අතර, ව්‍යවහාර වන 'උත්සාහවන්තයා ජය ගනී, උඩ පැන්නොත් බිම වැටෙයි' වැනි ලාභ ආප්ත ක්‍රිස්තු වහන්සේ වැනි ශ්‍රේෂ්ඨ චරිතයක දේශනා පාඨ වලට හිලව් කිරීමට කරන උත්සාහය සැබැවින්ම ගර්හා කටයුතුය.

ලිපියේ හය වැනි ඡේදය බලන්න. ඉස්ලාම් හා ක්‍රිස්තු ධර්ම, කර්ම සංකල්පය විශ්වාස නොකරන දේව ආගම් බවත්, දේව ආගම් වලට අනුව මිනිසාගේ හොඳ නරක ක්‍රියාවලට විපාක ලබා දෙන්නේ දෙවි කෙනෙකු විසින් බවත් රේමන්ඩ් මහතා පවසයි.

'දෙවියන් තමාගේම මැවීම වූ මිනිසාට දඬුවම් කරති'යි මා කියවා ඇති බයිබල් පොත් පත් ව සටහන්ව නැත. එසේ ඇත්නම් මට සමාවෙන්න. බොහෝ බෞද්ධයන් අතර ද පවත්නා මෙම මතය අසරණයින් හෝ දුර්වලයින් විසින් පසු කලෙක සිය ආගම් වලට යා කෙරන ලද මතයකැයි මම විශ්වාස කරමි. තමන්ට අසාධාරණයක් වූ විට එම අසාධාරණය පියවා දැමීමට හැකියාවක් නැති බෞද්ධයෝ 'දෙවියන්ට පෙනී යන්.'යැයි කියන අතර කිතුණුවෝ ''දෙවියන් වහන්සේ නිසි වේලාවට මොවුනට දඬුවම් කරනු ඇතැයි'' සිතා සැනසෙති. දෙවියන් වහන්සේ තම මැවීමට දඬුවම් නොකරන බවට පහත උදාහරණය ප්‍රමාණවත් වේයැයි සිතමි. මවු කුසින් බිහි වන විටම දෑස් අන්ධ වූ දරුවෙකු දෙස බලන්න. දෙවියන් වහන්සේ ඔහුට මෙම දඬුවම් දුන්නේ ඔහු කිනම් වරදක් කළාටද? දේව ආගම් වාදීහු භව ගමන ප්‍රතික්ෂේප කරති. ඔවුනට අනුව බිහි වන සෑම දරුවෙක්ම අලුත් නිර්මාණයන්ය.

මා ප්‍රිය රේමන්ඩ් මහතාණෙනි, කුඩා අකුරු සහිත ලොකු බයිබල් කතා පොත් ද ඇත. දැන් අප දෙදෙනාම මහලු බැවින් කියවීම පහසු වීම පිණිස අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් රදගුරු හිමිපාණන් විසින් ලොකු අකුරින් ලියා ඇති 'දෙවිඳාණෝ දරුවන් අමතන්නාහ' පොඩි කතා පොතේ අනු හතර පිටුවේ පළමු ඡේදය කියවමු. දෙවියන් වහන්සේ සිය මැවීම වූ මිනිසාට දඬුවම් නොකරන බැව් එවිට අපට වැටහේවි .

පාවුලු අපෝස්තුලුවරයා ලියන පරිදි දෙවියන් වහන්සේ අප මවා ඇත්තේ විනිශ්චය කර දඬුවම් දෙන්නට නොව, ජේසු සමිඳුන්ගේ මාර්ගයෙන් ගැලවීම ලබා ගන්නා පිණිසය. (1 තෙස 5/9-10) අප කිසිවිටෙකත් ආගම් කතෘන් වහන්සේලා වෙනුවෙන් කතා නොකළ යුතුය. ඒ මක්නිසාදයත් අප උන්වහන්සේලා තරම් ප්‍රඥාවන්ත නොවන බැවිනි. අප කළ යුත්තේ ආගමික ඉගැන්වීම් අතර ඇති සාම්‍යයන් සොයා බලා ඒ ඔස්සේ ආගමික සහජීවනය කරා යොමු වීමයි. අපගේ පටුමත වාදයක් රැක ගැනීම පිණිස උන් වහන්සේලාගේ දේශනා පාඨ වලට විකෘති අර්තකථන නොදිය යුතු අතර එසේ කිරීම අප එකිනෙකා ආගමික වශයෙන් ඈත් කර තබයි.

දයාබර රේමන්ඩ් මහතාණෙනි, ඔබගේ පසුගිය ලිපිය කියවීමේදී මීට වසර හතලිස් පහකට පමණ පෙර තරුණ වියේ පසුවූ අප නොයෙකුත් කරුණු අරබයා වාද විවාද කළ අයුරු ජීවමාන වෙයි. කෙසේ වෙතත් මෙතනදී මම ඔබගෙන් සමු ගනිමි. අප ඥාණවන්ත වන්නේ අපගේ ඥාණය නිවහල් වූ පමණටය.

'' පටු අදහස් නම් පවුරින් ලෝකය
කැබලි වලට නොබෙදී - ඥාණය නිවහල් වී......''



ටී. ඒ. පී. ගෝමිස්
(624)
011 2926374.




## The Haircut

One day a florist went to a high class saloon for a haircut.

After the haircut, he asked about his bill, and the barber replied, 'I can't accept money from you, I'm doing community service this week. 'The florist was pleased and left the shop.

When the barber went to open his shop the next morning, there was a 'thank you' card and a dozen roses waiting for him at his door.

Later, a cop comes in for a haircut, and when he tries to pay his bill, the barber again replied, 'I can't accept money from you, I'm doing community service this week. 'The cop was happy and left the shop.

The next morning when the barber went to open up, there was a 'thank you' card and a packet of sweets waiting for him at his door.....


The a Member of Parliament came in for a hair - cut, when he when to pay his bill, the barber again replied, 'I can't accept money from you, I'm doing community service this week. 'The MP was happy and left the shop.

The next morning when the barber went to open up, there were a dozen M. P. S. lined up waiting for a free haircut.

And that my friends, illustrates the fundamental difference between the citizens of our country and some politicians who run it.

BOTH POLITICIANS AND DIAPERS NEED TO BE CHANGED OFTEN AND FOR THE SAME REASON!

Parakrama Jayasuriya (815)



# Beauty

In an earlier essay I described that the feelings of sorrow and happiness are two compelling influences for the act of living. Though not so powerfully another incentive for the same purpose of living is beauty. Mother Nature usefully utilizes this pleasant stimulant in almost the whole of animal kingdom. It culminates its effect on the most mentally developed animal the man. The plant kingdom is not left out, for plants create lot of beauty to attract animals and insects whether themselves enjoying it or not.

New born of the animals big and small are daintily attractive. Puppies and kittens for example how much they please us with their sweet and cute appearances. What a world of joys a mother has if her baby is healthy and beautiful. The charm in babies and infants serves them to be protected and looked after the better. In the lives of animals, next big role for beauty is when they reach the age of mating. Nature in its bid to make the young ones mate and reproduce, embellish them with charm and beauty, most compelling to the opposite sexes. The powerful charms created for the purpose are multi sensual. They affect sight, hearing, smelling and touch, all with an effect of enticing beauty and attractiveness. The result is the mad move for mating. But sadly cunning nature does just the opposite to the old. Robbed of all charms and beauty, how they are left often in isolation, on the road to elimination.

We had a glimpse of the role beauty plays in the field of mere elementary biological existence. But, human aesthetic perception seems to go beyond just the physical aspect of it. With the developed intelligence man is capable of perceiving beauty in the intellectual and spiritual levels too. Thus he sees beauty in the expression of ideas, and literature is an ever enlarging occupation mostly due to its aesthetic taste. Still higher in level is man's sense for beauty in law logic and reasoning. Minds of mathematical men do revel in perceiving logical beauty as they reason out to discover and develop their new knowledge. Then there is beauty in logical argument. Except for the miscreants, there is grace and charm in law and order. How pleasant it is to reflect on the orderly movements of celestial bodies over the lengthy epochs of time, according to the laws of gravitation. Thus on the intellectual plane there is beauty in linguistic expression, law, logic and reasoning.

Man also seems to perceive beauty in spiritualism, another higher exercise and pursuit in him. With arduous denials for worldly pleasures, and concentration of the mind, genuine mystics and saints are said to experience blissful states with their motivated spirits. Probably the bliss and ecstasies that the refined and elevated spirits perceive are caused by the mental sights and visions of beauty in the higher planes of existences. However it may be, not going that far, there is beauty even in a simple virtuous life restraining the ego and wishing good for others.

Thus beauty is operating at several stages of living. The beauty of flowers, its presence in scenery song and music, in plants, birds and animals is all meant for the desireful living of man bird and beast. Though seemingly mindless, how the plants offer beauty and attractions to animals and insects is a mystery. Now, the tendency for progress in nature appears to favor man. He has been endowed with a superior mind. It has opened for him vistas of higher planes intellectual and spiritual. On such planes he is being urged by beauty too, for the forward movement and evolution. So obsessed with it some say God is Beauty.

**W.D.A. Raymond**



# ගීයක් වූ ගීතා - මතක තියා ගියා



මහ බැංකුවේ සේවකයින් සියළු දෙනාටම සෙත සලසමින් දැනුදු එම කටයුතුවලම යෙදී සිටින මහ බැංකු සේවක සංගමයට අතීතයේ පැවැතියේ අනේකවිද තර්ජනයන්ට මුහුණ දීමටය. ඇවිලන් චතුරස්‍රයේ විනිමය පාලන දෙපාර්තමේන්තුව පිහිටා තිබුණු සමයේ (ඒ ගොඩනැගිලි අශ්වයින් ගාල් කරන ස්ථාල 25කින් සමන්විත වූවකි.) එක්තරා රාත්‍රියක නොමන් විජේසිංහ සහෝදරයාගේ සහ තවත් සහෝදරයින් කිහිප පලකගේ නායකත්වයෙන් පිහිට වූ ඉහත සංගමයට අඩු පාඩුව පැවැතියේ මානව සම්පතයි. මහ බැංකුවේ එවකට කොතරම් යතුරු ලේඛිකාවන් සිටියත් ඒ එක් අයෙක්වත් සංගමයේ වැඩක් තම යතුරු ලියනයෙන් නිම කිරීමට දැක්වූයේ ඉමහත් භීතියකි. ගීතා මනුකුලසූරිය සොහොයුරිය බැංකුවට බැඳුනු දිනයේ සිට අපගේ සංස්කෘතික සංගමයට, උල්පත සඟරාවට, සිනෙරු සඟරාවට, ක්‍රීඩා සමාජයට අප විසින් මෙහෙය වූ පුස්ථකාලයේ කාඩ් පත්‍ර, හැඳුනුම් පත්‍ර මෙන්ම මරණාධාර සංගමයේ සාමාජික කාඩ් පත් අපට නොමිලයේම යතුරු ලියනය කර දුන්නාය. සමහර අවස්ථා වල අසල අවන්හල් වලින් අපට මෙන්ම ඇයට ද තේ, උළුඳු වඩේ සඳමහර විට රටත් වඩා බර ආහාර ඇගේ මුදලින්ම ගෙන ආවේ තනිවම අඳුරුව පැවැති කොළඹ කොටුවේ රෝහල් වීදියේ පයින් ගමන් කරමිනි. මෙයට හේතුව ඇය නිර්භය කරාටේ ක්‍රීඩිකාවක් ද වූ නිසාය.

මහ බැංකු විශ්‍රාමිකයන් සියළු දෙනාම පාහේ ආදරය දිනා ගත් ජී. ආර්. ඉලංගසූරිය මහත්මිය (ගීතා) 2014 දෙසැම්බර් 07 වැනිදා අප අතරින් සදහටම වෙන්වූවාය. දෙසැම්බර් 08 වැනිදා හිතවතුන්ගේ සෝසුසුම් මැද බොරැල්ලේ ජයරත්න අවමංගල්‍ය ශාලාවේ සිට ඉදිරිපස කනත්තේ නිසල පරිසරයක ඇයගේ දේහය මිහිදන් කෙරිණ.

මහ බැංකුවේ ආගමික, සමාජීය, සංස්කෘතික සෑම කටයුත්තකදීම සක්‍රියව දායක වූ ගීතා මහ බැංකුවේ සේවකයන් අතර ඉතාමත් ජනප්‍රිය චරිතයක් විය. ආගමික වැඩ සටහන් වලදී ඇය දැක්වූ උනන්දුව මහ බැංකු සේවකයන්ට කිසිදා අමතක නොවේ. භක්ති ගීත වැඩසටහන් වලදී ඇයගේ ගායන හැකියාව මනාව ප්‍රදර්ශනය කරන ලදී.

මස් මාංශ වලින් තොරව එළවළු සහ පළතුරු පමණක් ආහාරයට ගත් ඇය කුරා කුහුඹියෙකුට පවා හිංසාවක් නොකරන ලදී. බෙදාගත් බත් පත පවා අසරණයෙකුට පිරිනමන කාරුණික හදවතක් ඇය තුළ විය. ඇය සමඟ කිට්ටුවෙන්ම ඇසුරු කළ මහ බැංකු සේවකයෙකු වශයෙන් මට අද කළ හැක්කේ ඇයට නිවන් සුව අත්වේවායි පැතීම පමණි.



ධර්මසේන වැලිගම.

# ගාමිණී චන්ද්‍රසේන !



| | |
|---|---|
| හස රස ගැන | කියූ |
| කියා බලා | ලියූ |
| ලියා අපට | එවූ |
| එවා සතුට | බෙදූ |

ඔබට නිවන් සුව පතමු !

 අපේ පිටුව අපේ පිටුව අපේ පිටුව

සංවේදී බව මනුෂ්‍යත්වයට හා මිනිස් සන්තානයට ගෙන දෙන්නේ අසීමිත අගයකි. එය හැම කෙනෙකු තුළම පවතින්නේ නම්, ලෝකය කෙතරම් මිහිරි තැනක් වනු ඇත්ද?. සංවේදී ගුණය හෙවත් හෘදයාංගම ගුණය හැම පුද්ගලයෙක් තුළම නැති නිසාම ඊට ඇත්තේ අසීමිත අගයකි. කර්කශ සමාජය සුහුඹුල් වන්නේ සංවේදී පුද්ගලයාගේ හෘද සාක්ෂියේ සක්‍රිය තරංගාවලිය නිසාවෙනි. ''පරදුක්ඛෙ සති සාධුනං හදය කම්පනං කරෝතීති කරුණා'' යනුවෙන් ''අනුන්ගේ දුකක් දුටු කල්හි සත්පුරුෂයාගේ හදවත කම්පා වේ නම්, එය කරුණා ගුණය වේ.'' යනුවෙන් බුද්ධඝෝෂාචාරීන් දාර්ශනික ගැඹුරුවකින් පැහැදිලි කරන්නේ ද එම සංවේදී ගුණය පිළිබඳව ය.



මීගමුව කවදත් සංවේදී මිනිසුන්ගේ නිජ බිමකි. ප්‍රකට රංගන ශිල්පීන්, වෛද්‍ය වෘත්තිකයන්, ගුරු භවතුන්, සමාජ සේවකයන්, ව්‍යාපාරිකයන් ආදී විවිධ ක්ෂේත්‍රයන් හි කැපී පෙනෙන ප්‍රකට චරිත මීගමු පුරවරයෙන් සිරිලකට දායක කොට ඇත.

ඇය ජන්ම ලාභය ලැබුවේ සුන්දර මීගමුවේ හෙවත් මීගමුපුරවරයේය. පියා පැරණි පොලිස් නිලධාරියෙකු වූ නිසා අධ්‍යාපනික කටයුතු වලට යොමු වීමට ආයාසයක් නොවීය. මීගමුවේ ප්‍රකට ආවේ මරියා විදුහලින් හා කොටිවේ ආනන්ද ශාස්ත්‍රාළයෙන් ද සිප් නැණ උරා ගත් ඇය විදුහල්වල කැපී පෙනෙන ශිෂ්‍යාවක වූවාය. 1960 දශකයේ උසස් පෙළ හදාරමින් සිටියදී ඇගේ සොහොයුරාගේ පෙරැත්ත පිට ශ්‍රී ලංකා මහ බැංකුවේ ලිපිකාර පත්වීමක් සඳහා ඉල්ලුම් කළාය. ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් ඉහටත් උඩින් සපුරා කිබුණු ඇය 1965 දී අග්‍රගණ්‍ය මූල්‍ය අධිකාරිය වන ශ්‍රී ලංකා මහ බැංකු සේවාවට බැඳුනාය. සිංහල භාෂාව හා ඉංග්‍රීසි භාෂාව මනා ලෙස හැසිරවීමට සමත් වූ ඇය මහ බැංකුවේ දෙපාර්තමේන්තු රැසකට අනුයුක්තව සේවය කළාය.

පාසැල් වියේ සිටම දක්ෂ, කාර්යක්ෂම, ක්‍රීඩා ශීලි කැපී පෙනෙන චරිතයක් මෙන්ම රූබර පෙනුම ද කාගෙත් නෙත් සිත් බැඳ ගැනීමට හේතු විය.

ඒ ලෙසින් මහ බැංකුව තුළ කටයුතු කරත් දී මහ බැංකුවේ ක්‍රියාශීලි තරුණයෙකු වූ වෑගොඩපොළ මහතා සමග යුග දිවියට පිවිසියාය. දරු දැරියන් තිදෙනෙකුගේ මවක් වන ඇය අප සංගමයේ ද ක්‍රියාශීලි සාමාජිකාවකි. රත්තොට ප්‍රදේශයේ ක්‍රියාශීලි දේශපාලනඥයෙකු වූ වෑගොඩපොළ මහතාගේ හදිසි අභාවයෙන් පසුව දරුවන් සමඟ මෙලොව තනිවූ ඇය දිරිය කාන්තාවකි. සෙනෙහෙබර මාතාවකි. දයාබර සොහොයුරියකි. නිහතමානී, ත්‍යාගශීලි, කුල කාන්තාවකි.

බම්බලපිටිය නගර මධ්‍යයේ විශ්‍රාම සුව විඳිමින් දැවැන්ත සමාජශීලි කටයුතු වලට නොමසුරුව දායක වන ඇගේ නිවහන සිද්ධස්ථානයක සිරි උසුලයි.

සංගමයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වයට නොමඳ පිටුවහලක් වන සංවිධාන කටයුතු (මාසික රැස්වීම, සැළව තැපැල් කටයුතු) ආදිය සඳහා ඇගේ නිවස්නය මහා ආශිර්වාදයකි. ඒ අතරතුර නිර්ලෝභි, ත්‍යාගශීලි ඇගේ දායකත්වය ඔබ සැම වෙනුවෙන් කෙරෙන නිර්ලෝභි ප්‍රදානයකි.

නිර්ලෝභි, ත්‍යාගශීලි, සමාජශීලි, ඇය වනාහි අන් කවරෙකුවත් නොව, සාඩම්බර කුල කාන්තාවක් වන අයිරාංගනී වෑගොඩපොළ මැතිණියයි.

(නිමිත්ත - ඥාණා රණතුංග
සොයුරියගේ ජ්‍යේෂ්ඨ පුතණුවන් ද
පසුගිය දා හදිසියේ මිය ගිය වගයි.....)

## දුකම තුරුලු කර !

පපුතුරෙහි ඇවිල ගිය
ලසෝ ගිනි කඳ
නිවී යන විට සෙමින්
අහිමිව හිමි
දසවස ද සපිරි !
දෙ ඇස මෙන්
තිබෑ සුරැකී
පුතුන් අතුරෙන්
වැඩිමලා ගිලිහී
වැටුනි ඇකයෙන්
පුරුදු විදියට
නොඑන විලසින් !
සදාදර හිමි
දයාබර පුතු
හැර ගිය ද නොසිතූ අයුරින්
පටාචාරාවක නොවී සිහියුන්
කිසා ගෝතමියක ලෙසින්
නොමළ ගෙයකින්
සොයා අබ මිට
නොයමි ගෙන් ගෙට !
මතක පොදියට
එකතු කරගෙන
අතීත සැමැරුම්
කඳුලු අමුනමි
දුකම තුරුලු කර !



**ජගත් කාරියවසම් (1215)**
**038 - 2236643**
**077 - 9507184**

ගම්මානය එකම කැදැල්ලක හැදී වැඩී විසිරී ගිය කුරුල්ලන්ගේ රජ දහනක් බදුය. සියල්ලෝම නෑසියන් වූහ. ඔවුහු ඇළ ලඟද, දොළ ලඟද, කෙතෙහි ද, කමතෙහිද නිදහසේ කතා බස් කළහ. ඒ කතා අතර ආදර කතා ද නොතිබුණා නොවේ. මේ එවන් කතාවක අවසානයි.

## මල් සුවඳ තැවරුණා.

වෙල් යාය මැද ගිහින් ගිරි පොද වැස්සක
ඕනෑවට අපි තනි වෙලා
මට නාම මතකයි ඇයත් සමගින්
කෙළිදොලෙන් මා පසු වුනා



ඔට්ටු සෙල්ලම් කර
මා හඹා ආ ඇගෙ
සිගිති රත් පතුල් යුග
නැවුම් ඉපනැල්ලට
කැපේ යැයි මා බයවුනා

දෙවැට පාරෙන් අවුත්
පොල්වත්තෙ ගල් වැටියෙ
නාන ළිඳ ළග හමු වුණා
හමු වෙලා ඈ පෑසිනාවට
දෙවැටෙ මදුමල් පැරදුනා

සවස පන්සල් යන්න
ගෙයි මිදුලෙ පඳුරු වල
එල්ලිච්ච බෝලිද්ද
මල් කැඩූ ඇගෙ දෑතෙ
මල් සුවඳ තැවරුණා

අම්ම එක්කල
එකතු වී අප
පෝය දා පන්සල් ගියා
බෝ මළුවෙ සඳ එළියෙ
ඇගේ ලස්සන වැඩි වුනා

පුර පෝය ගතවුනා
අමාවක මතුවුනා
එවැනි දේකට
අපේ නෑකම්
සුදුසු නැහැ යැයි කියවුනා

ගිය නමුදු පන්සල්
මට නොවුණි පෙර පින්
බෝ මළුවෙ සඳ මඩල
වෙනත් ලොවකට
පිවිසුනා.



**හෝමි (624)**
**011 2926373**

## V. R. S. වලින් නිමා වූ ගමන.................!

“හැට නමයේ මැයි තුන”-හිරු හැගුණේය
ගිම්දිරියේම “කොටුවට” සැම ඇදුණේය
අටටත් කලින් “මහ බැංකුව” සෙවණේය
තිස් හතරක් දෙනා අලුතෙන් බැඳුණේය!

නැවුම් සුවඳ පිරි ලිපි එක එක බෙදලා
ලිපිකරු, මුදල් අයකැමි තනතුරු දීලා
ඒ ඒ අංශ වෙත කණ්ඩායම් කරලා
බැංකුවෙ සේවයේ මුල් පියවර තබලා!

දිවා විවේකයේ අප එලියට බැහැලා
දුටු දේ අඳහන්නේ - කෙලෙසද සතුටු වෙලා
“ඊයේ සරසවියේ අද බැංකුවේ” කියලා
සටන් පාඨ ගෙන සංගම් උරණ වෙලා!

කාලය ගෙවෙද්දී “යූනියන්” අමතකය
කවුරුත් සිනාසි සුහදව සේවෙහිය
ගුරු හරුකම් දෙමින් අත - හිත දුන්නෙහිය
ඒ අත්වැල නිසා සේවය දිලුනේය!

යොවුන් සිතට ආදරයේ සුවඳ ගලයි
කෝලගතිය පෙම් බසකට දොරටු වසයි
හිත මිතුරන්ගෙ සහයෝගය නොමඳ ලබයි
කලකදී “එයා” එක වහලක් යටට ගෙනෙයි!

ඇනෙක්ස් සොයා දී පසු බිම සකසා දෙයි
දුක සැප බලා මව්පිය මෙන් ළඟින් හිඳියි
දරු සුරතල් බලද්දී උන් ළඟම රැඳෙයි
ඉදිරිය සේම අග හිගකම් නිතර සොයයි!

ඈත ගම් වලින් ඇවිදින් සිදාදියේ
පැල පදියම්ව දිවි ගෙවනා සැටි සරියේ
ඔවදන් දෙමින් දිරි ගන්වා නිති ලඟියේ
සිතුවම් විලස බැංකුවෙ සැම ළඟ සිටියේ!

තිස් තුන් වසක් සේවය කළ මුත් එකට
සිත ගෑ බිඳී කලකිරුණේ සත්තකට
අමනාපකම් ඇති වුවත් මොහොතකට
දෙදහස් දෙකෙන් පසු වැඩි බර මිතු දමට!

බැංකුවෙ සහෝදර කම මුළු ජීවිතයයි
මළගම දාට ගුණ ගියත් එයම තමයි
දිවි ඇති තුරා රැකගත යුතු එක පැතුමයි
මතු අත් බවෙත් එක පියසක ඉපදෙන්නයි!

(ප්‍රේමා චන්ද්‍රසේන - 3137)

## කතිරෙන් වූන හිදිය

බස්නාහිරට වැහි වැටෙනා අතර තු රේ
ඌවට උතුරු මැද පැත්තට නියං සැ රේ
තම්මැන්නා පුරට දල්වා පහන් නි රේ
**හික්මුව ඇමති දැන හැඳුනුම පිරිත් කෙ රේ**

ගිනිකන වැටුනවුන් කළ යුතු දේ හොඳැ නා
දුරුවී සැබෑවෙන් බහුජන දිවි නසි නා
පටවන කොටන් ලොරි හොර පාරෙන් පති නා
**දිය පොද නසා 'කියුබික්' අඩි මිල කර නා**

බැද්දේ මරු ද බත් මිස පස් කන්නෙ නැති
බත් දෙන දෑත් වෙව්ලයි දිය පොදක් නැති
පොළොවේ තෙතමනය ගස් වැල් රකිති නිති
**මේ බැව් නොදන්නෝ කැදර මැති ඇමති**

කොටන් සොරුන් ගුලි කර දෙන මිටියක ට
මුරකරු පෑන ලියවෙන්නේ කන පිට ට
කාසිය ළඟට එන උස තඩි වයරය ට
**පෙම් කව් ලියයි කාපට් මග කාලය ට**

රජුගෙන් කිසිත් ගහ කොළ නැත ඉල්ලන් නේ
ගෙඩි පොතු කොළ මලුත් ආයුෂ වඩවන් නේ
කළගුණ නොදත්තෝ නැත ඒ ගුණ දන් නේ
**මිනිසෙක් බවට කවුරුද 'බලපත්' දුන් නේ**

ගුම්ටි තියන බකමූණගේ සවුදම ට
පුප්පන ගැරඬි කැබලිති කොළ පාන කො ට
ගිඳිකුම්බා පඳුරු යායක කෙදිරිය ට
**වැට හා නියර කති කෙත ජය පිට ජය ට**

තුලා බරට සොබ දම් හිමිය මුලය
බිඳ දැමුවොතින් දෙන දඬුවම් සැර වැඩිය
පොතේ නීති මෙන් සකසා ගනු බැරිය
**වහං කළ හැකිද කතිරෙන් වූන හිදිය ?**



අමරපාල කරසිංහ ආරච්චි (1230)
(078 5863155)

## කවිකම රස'ඳුනකි.

1. බැංකුවේ සේවන ලැබ සිටියත් කලක  සිට
අප දෙදෙනා අයිති එහි යුග යුවල  කට
මුණ නොගැසුණත් එහිසා අප කිසිම  විට
අමරේ, ඔබේ කම්කම රස'ඳුනකි  මට

2. කිරි - පැණි - අල - බතල වැනි ඉම්හිරි  කෑම
අඩු නැති රුහුණු පුර පිනකි ය ඉප  දීම
මා වාගේ ඔබත් 'මාතර'යෙකු  වීම
සතුටකි, මගේ සිත සනසන සැම  දාම

3. පැදි පෙළ තුළින් මා ගෙවූ කාලයෙ  තුරුණු
ඔබ මතු කළා, මට අමතක වූ  කරුණු
සිහිකළ ඒ යුගය මිතුරන් පිරි  වැරුණු
තුති දෙමි, ඔබට සතුටින් හදවත  පිරුණු

4. 'බොඳු පැදි හා ගීත' ගොන්නක් එකට  ගෙන
වත්තේගම කිව්ඳු පළ කළ කෘතිය  ගැන
කිවහොත් 'එකම මී වදයකි' මිහිර  දෙන
කියවා ඔබත් එහි අම රස විඳිනු  මැන

5. 'සැන්දෑ' කලාපය ඔපවත් කෙරෙන  ඉබේ
කවි - කිවිඳියනි, සුරතට පිරි නැමෙන  ඔබේ
ඇරයුම මෙයයි, කවි මඩුවෙහි ගගන  ගැබේ
එනු මැන, බබලන්න. එහි ඉඩ ඔබට  තිබේ.

6. දුල්මන්, ජගත්, යසනායක අතර  තුරා
ප්‍රේමා, ගෝමි, විමලා කවි රසය  උරා
නව කවියන් සමග සරසවි කිරුළ  දරා
පියවර නැගිය යුතුම ය, කවි මඩුව  කරා

7. ආ ගිය කතා බැංකුව තුළ සරු  සාර
නිසඳැස් - සඳැස් ලෙස ගොතමින් කවි  හැර
ගිත මිතුදම් වඩන්නට මොහොතක්  නැර
මින් පසු කවිමඩුව ඔබ සැමට ය  බාර

8. දෙතොල'ග සිනාවෙන් සොහොයුරු දම  වැඩුව
ඔබ - අප සමග කවියෙන් තොරතුරු  දෙඩුව
පුරවා ලතා නැගණිය නැතිවුණ  අඩුව
ගෙන යමු ඉදිරියට 'සැන්දෑ' කවි  මඩුව



ලාල් හේවාපතිරණ(151)
(0714357606)
(මිහිසත මාතා පද්‍යාවලියෙන් උපුටා ගැනිණ)

පැදි විදි  පැදි විදි

## එන්න ඔබත් කවි මඩුවට

යහගුණ පිපුණු මනුසත වාසනා  වන්
මිනිසත්කමට ' කවිකම' වාසනා  වන්
දෙවු පුරවැසි ඔබේ සිත වාසනා  වන්
'කවි මඩුවටයි' මේ ආරාධනා  වන්

නෙත්දෙක අරිමු මනුගුණ විනිවිද  දකිමු
අව්තෙන් ගිතමු අන් හැම රසවත්  කරමු
පන්හිඳ ගනිමු පැදිවැල් ඉන් පෙළ  ගසමු
සිව්පද ගොතමු විරිතට මිහිරක්  තබමු

පසුවුන ගෙවුනු කාලය ගැන මතකයි  ද?
' සැන්දෑ ' සමය ගැන දැනුනේ නැහැ නේ ද?
' පළමු පෙමක ' මිහිරෙන් හිත පිරෙනව  ද?
' කවි මඩුවට ' ඇවිත් ඒ ගැන ලියනව  ද?

සඟවාගෙන ඉන්න විටදිත් කතියන්  නේ
කියාගන්න බැරි නම් හිත හිරවෙන්  නේ
විදුලිය එළිය සේ පෙනි පෙනි සැඟවෙන්  නේ
'ප්‍රථම ආදරේ ' රහ මෙහෙමද දන්  නේ.

' ප්‍රථම පෙම'  මිහිරියි
රසට පද  ලියවෙයි
කවි කිවිඳි  ඔබටයි
'කවි මඩුව'  ඇරඹෙයි

- සංස්කාරක -

# අපූරු සොඳුරු ඇඳුරු.

මෙම සටහනට බඳුන් වන කරුණු බොහෝ සෙයින් අතීත ගුරුවරයෙකු සතු වූ චරිතාංග ලක්ෂණ මෙන්ම තත්කාලීන සමාජ චරිතාකම්වල සහසම්බන්ධතාවය ඉස්මතු කර පෙන්වන්නකි. අප පියාගේ බාල සොයුරිය එනම් නැන්දා පාසල් ගුරුවරියකි. ඇය විවාහව සිටියේ ගුරුවරයෙකු සමඟය. එම මාමා සහ නැන්දා අපගේ මෙන්ම ගම් ප්‍රදේශයේ සැමගේ ගෞරව භක්තාදරයට ලක්වූවන් විය. මෙහිදී වඩාත් කැපී පෙනෙන චරිතය වූයේ මාමාය. ජාතික ඇඳුම් අඳින එතුමා උසින් අඩි 6කේ පමණ වූ ආරෝහ පරිණාහ දේහධාරී අයෙකු ලෙස හැඳින්වීම නිවැරදිය.

කාලයට අනුව සෑහෙන උගත්කමක් තිබුණු එතුමා දැනුම සහ අවබෝධය අතින් ඉතා පිරිපුන් බවක් පෙන්නුම් කළේය. එසේම ඇසූ පිරූ තැන් ඇති අයෙකු ද විය. පන්තියේ ළමයින්ගේ අවධානය යොමු වන සේ ඉගැන්වීමේ විලාශය සහ ශෛලිය මැනවින් සකසා ගෙන තිබිණ. සිංහල භාෂාව, සාහිත්‍යය සහ ප්‍රජාචාරය වැනි විෂයයනට විශේෂ කැමැත්තක් එතුමා සතු විය.

| | |
|---|---|
| මාතගම | මහතා |
| පන්තියට එනු | තියතා |
| පෙරළා පොත | පතා |
| කියයි පාඩම හරිම | උගතා |

මේ එතුමා ගැන ලියවුණු හිට්වන කවියකි. සිංහල විෂයට අදාළව සාහිත්‍ය රසය උකහා ගනිමින් කරන ඉගැන්වීමේ විලාශයට සැවොම වාගේ බෙහෙවින් ඇළුම් කළහ. කව් රස වින්දනයේදී මුලින්ම ගීතවත්ව එම කවි ගායනා කොට අනතුරුව අරුත් පහදමින් රසවත්ව ඉදිරිපත් කිරීම එතුමාගේ පිළිවෙතයි.

දව වෙණ මිහිර පවතී කැත කොවුළු | තුඩේ
මුතු ඇට සැදෙයි දියයට බෙල්ලෙකුගෙ | බඩේ
සියපත් පිපෙනු ඇත පිළි ගඳ ගොහොරු | මඩේ
අගනා මැණික් කළුගල් අතරෙහි ද | වැඩේ

උක්ත කවිය ගායනා කොට අරුත් පැහැදිලි කළ අයුරු අදට ද සිහිපත් කළ හැකිය.

උගන්වන අතරතුරේදී කිසියම් ළමයෙකු තම අවධානය වෙනතකට යොමු කර සිටිනු දුටු විගාම එතුමා ක්‍රියා කරන ආකාරය නිර්මාණශීලිය. එහිදී දෙන අවවාද සහ සුළු දඬුවම් සදා මතකයේ රැඳෙන සුළුය.

දිනක් පාඩම හමාර වීමට ආසන්නය. ඒ වේලාවේදී විවේක කාලය සඳහා සීනුව නාදවත්ම ළමයින් කිප දෙනෙකු කඩිනමින් පොත් වසා තබනු එතුමාට පෙනුණි. එකෙණෙහිම එම ළමයින් පන්තිය ඉදිරියට කැඳවන ලදී. අනතුරුව එම ළමයින් අමතා, "ඔය ළමයි හරියට වතුවල වැඩ කරන කම්කරුවන් වාගේ. ඒ මිනිසුන් පිඩැලි කැපීමට එසවූ උදැල්ල කණිසම ඇසුණු විගසම කෙලින්ම තම කරේ තබා ගෙන ගෙදර යනවානේ." කියමින් ළමයින්ගේ අලසකම නැති කොට උනන්දු කිරීම සඳහා උපහැරණ දක්වමින් ඔවදන් දුන්නේය.

නිතරම වාගේ පිල් බෝල සෙල්ලම් කිරීමට ප්‍රිය කළ ළමයි තම කලිසම් සාක්කුවල පිල් බෝල පුරවා ගෙන සිටීමට පුරුදුව සිටියහ. දිනක් පාඩම කියාදෙන අවස්ථාවේදී පිල්බෝල කිපයක් බිම වැටී පෙරළී යන හඬ ඇසුණි. එහිදී එතුමා "කාගේද ඒ අසිරි පඤ්ජරය බුරුල් වුණේ" කියා විමසීය. අනතුරුව එම ළමයිනට අවවාද කළේ හැමෝටම හොඳට මතක හිටින පරිදිය.

පන්තියේදී අභ්‍යාස කිරීමට පැවරූ අවස්ථාවකදී සමහර ළමයින් කතා බහ කරමින් සිටිනු දුටු එතුමා "මොකද මේ දෙමලිච්චන් මල්ල පොළොවේ ගැහුවා වගේ කතාව දිගටම." යයි පවසමින් ඔවුනට සෙමින් පහර කිහිපයක් ගසනුයේ ගතට නොව හිතට දැනෙන පරිදිය.

දිනක් ළමයින් කිහිප දෙනෙකු කිසියම් කෑමක්

කමින් පාඩමට අවධානය යොමු නොකර සිටිනු එතුමාට පෙනුණි. අනතුරුව එතුමා එම ළමයින් අමතා "ළමයිනේ අප ඉන්නේ කන්නද ?කන්නේ ඉන්නද ?" යනුවෙන් විමසිය. එවිට එක් කටකාර ළමයෙකු "සර් අපි ඉන්නේ කන්න." යයි පිළිතුරු දුන්නේ සැමොම සිනහවට පත් කරමිනි. එතුමා එම ළමයා පන්තිය ඉදිරියට කැඳවා ඔහුට අත් දෙක ඉහළට ඔසවා ගෙන සිටීමට අණ කරන ලදී. එසේ කොට පන්තිය අමතා "මෙන්න හැමෝම බලා ගන්න මේ තමයි කෑමේ රුසියා" කිවේ එම ළමයා මෙන්ම අන් ළමයින් ද යහ මගට යොමු කර ගැනීමේ අරමුණෙනි.

විවේක කාලයේදී ළමයින් දුව පැන සෙල්ලම් කිරීමට කැමතිය. සෙල්ලම් කිරීමේදී ගැහැණු ළමයින්ගේ කොණ්ඩය අවුල් වීම සිදුවේ. දිනක් විවේක කාලයට පසුව පාඩම් කියා දෙන අවස්ථාවේදී ළමයෙකු තම කොණ්ඩය පීරා සකස් කරනු එතුමා දුටුවේය. එකෙනෙහි එම ළමයා අමතා "වරලසගොතනවා නේද ?" කීවේ සියුම් උපහාසයක් දනවන අයුරිනි. ඒ අනුව ළමයින් නැවත එබඳු ක්‍රියාවලින් අත් මුදවා ගෙන විනය සහ හැසිරීම පාලනය කිරීමට කටයුතු කළේය. එතුමාගේ පිළිවෙත සහ ක්‍රමෝපාය බොහෝ දුරට සාර්ථක විය.

මෙතුමා යම් රෝගාබාධයකින් පෙළුණි. එහෙයින් වෛද්‍ය උපදෙස් අනුව තම ආහාර රටාව සකස් කරගෙන තිබිණ. එහි නියම තතු නොදත් ඇතැම් අය එතුමා ඉතා ලෝභ, වියදම් කිරීමට අකමැති අයෙකු බවත්, ආහාර සඳහා විය පැහැදම් කිරීම සීමා කර ඇති බවටත් කතා කියන ලදී. එනමුදු ඉන් එතුමාගේ ජනප්‍රියත්වයට බලපෑමක් නොවීය. අසනීප වීමට පෙර එතුමා දක්ෂ වොලිබෝල් ක්‍රීඩකයෙකු ලෙස ප්‍රකටය. ඉන් පසුවද වොලිබොල් ක්‍රීඩා තරඟ වලදී "තරඟ තීරක" වශයෙන් එතුමා සේවය කරන ලදී.

දක්ෂ කථිකයෙකු වූ මෙතුමාට ගම් පළාතේ පොදු වැදගත් උත්සව අවස්ථාවලදී කතාවක් කිරීමට අනිවාර්යෙන්ම ඇරයුම් ලැබේ. පෙර සූදානමකින් තොරව පැහැදිලි හරවත් කථාවක් කිරීමේ හැකියාව නිසැකයෙන්ම මෙතුමා සතුවිය. අප පවුලේ වැදගත් උත්සව අවස්ථාවලදී අනිවාර්යෙන්ම මෙතුමාට කථාවක් කිරීමට භාර දෙනු ලැබීය. එබඳු සෑම අවස්ථාවේම කථාව ආරම්භයේ දී එතුමා පවසා සිටිනුයේ 'තමාගේ වීණාව තමාටම වාදනය කිරීමට අවස්ථාවක් ලබා දුන් බවයි.' විදුහල්පතිවරයෙකු වශයෙන් සේවය කිරීමෙන් පසුව මෙතුමා විශ්‍රාම ගනු ලැබීය. මෙතුමා මිය ගොස් දැනට අවුරුදු 20 ක් පමණ ගතවී ඇත. එතුමාගේ අවමගුල් අවස්ථාවේදී පාසලේ ආදි ශිෂ්‍යයෙකු ලෙස ප්‍රාදේශීය ලේකම්වරයෙකු විසින් අගනා ගුණ කථනයක් කරන ලදී. එහිදී ප්‍රකාශ වූ ඇතැම් අදහස් මෙම සටහන ලිවීමේදී උපකාරී වූ බව කෘතවේදීව සඳහන් කරමි.



ඒ. ජේ. ආර්. විමලා ධනපාල (3108)
0112 970561/ 0771624706

## In what way is separation from the pleasant suffering ? People

Temporary separation such as having to leave one's loved ones for another country to pursue further studies or career. Permanent separation due to the death of a loved one. Being abandoned by one's siblings.

**Places**
Having to leave the place of work which one considered pleasant due to the expiry of one's contract, leaving a country which one considered pleasant due to immigration laws.

**Objects**
The death of a pet or the breakage or loss of a favourite object.



D. E. Abeyweera
(507)
0112-913901

## දැනුම්දීමයි.

"සෑදෑව" හි පළකෙරෙන ලිපි හා අදහස් ආදියෙහි වගකීම ඒ ඒ රචකයා සතුවේ. සංස්කාරක සටහන් හැර අනෙකුත් රචනා පිළිබඳව සංස්කාරක මඩුල්ල හෝ විධායක කමිටුව වගකීම භාර නොගනී.

-සංස්කාරක-


# සෑදෑව
සඟරාව

ශ්‍රී ලංකා
මහ බැංකු විශ්‍රාමිකයන්ගේ
සංගමය
2015 ජනවාරි/ පෙබරවාරි.



වෙබ් අඩවිය : www.sendewa.org විද්‍යුත් ලිපිනය info@cbpa.com

අංක : QD/168/News/2014 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදී.



**ගරු ලේකම්,**
**මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය,**
**116/2/1B, බෝ සමිඳු මාවත, දොලේකනත්ත,**
**මහරගම පාර, පිළියන්දල.**



රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරණ ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව
ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමය විසින් නිකුත් කරන ලදී.

සෑදෑව - සංස්කරණය
අමරපාල කරසිංහ ආචාර්ය විසිනි.

Typesetting - **Graphicworld** - Panadura.
graphicworld.pan@yahoo.com
graphicworldit@gmail.com